02 APR 2019

******************************

# කළුතර මහාධිකරණය

## පිටපතකි.

## එච්.සී. 570/13

******************************

Scanned with CamScanner

0 2 APR 2019

<u>කළුතර අධිකරණ කලාපයේ මහාධිකරණය</u>

නීතිපතිගේ අංකය: CW 1/1 .....006

මහාධිකරණයේ අපරාධ
නඩු අංකය: HC 570/2013

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී

ජනරජය විරුද්ධව

01. වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න.

Scanned with CamScanner

02 APR 2019

01.වර්ෂ 2000 ක් වූ ජුනි මස 12 වෙනි දින හා 2000 ජුනි මස 17 වන දින අතර කාලයේදී මෙම අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ පිහිටි පයාගල පොලිස් ස්ථානයේදී යුෂ්මතා පැමිනිල්ල නොදත් අන් අයත් සමග මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන අය අයුතු ලෙස සිරකර තැබීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 333 වන වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

02.ඉහත කී 01 වන චෝදනාවේ සදහන් වේලාවේදී ස්ථානයේදී සහ එකී ක්‍රියා කලාපයේදීම යුෂ්මතා පැමිනිල්ල නොදත් අන් අයත් සමග මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන අයගේ මරණය සිදුකිරිමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 296 වන වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

03.ඉහත කී 01 වන චෝදනාවේ සදහන් වේලාවේදී ස්ථානයේදී සහ එකී ක්‍රියා කලාපයේදීම යුෂ්මතා පැමිනිල්ල නොදත් අන් අයත් සමග මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන අය පොලිස් අත්අඩංගුවේ සිටියදී යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනිම සදහා හෝ ඔහු විසින් හෝ තුන්වන තැනැත්තෙකු විසින් කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සදහා ඒ තැනැත්තාට දඩුවම් කිරිම සදහා වූ හෝ එකී තැනැත්තා හෝ තුන්වන තැනැත්තා බිය ගැන්විම සදහා හෝ ඔහුට බලකිරිම සදහා හෝ පහර දී වධ දීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වන වගන්තිය සමග කියවිය යුතු 1994 අංක 22 දරණ වධදීමට සහ අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඩුවම්වලට එරෙහිව සම්මුතිය පනතේ 2(1) වගන්තිය සහ 2(4) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කළ බවය.

අත්/කලේ

රජයේ අධිනිතිඥ.

වර්ෂ 2013 ක්වූ 02 මස 06 දින.

Scanned with CamScanner

02 APR 2019

පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරිමට අපේක්ෂා කරන දේ.

1. සිරකරුගේ රදවා ගැනිමේ ලේඛණයක්
2. බල අපරාධ තොරතුරු සටහන් පොතක්
3. දෛනික තොරතුරු සටහන් පොතක්.
4. අධිකරණ වෛද්‍ය වාර්තාවක්
5. පශ්චාත් මරණ පරික්ෂක වාර්තාවක්
6. ඇඳ හිසපතක්

<u>පැමිණිලි පක්ෂයෙන් ඉදිරිපත් කිරිමට අපේක්ෂා කරන සාක්ෂිකරුවන්</u>

1. මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති - අංක 315ඒ,වේරගල, පයාගල.
2. මුල්ලකන්දගේ දිපිකා ජයන්ති - අංක 453ඒ, මෝදර, මොරටුව
3. මාපිටියගේ පොඩිනෝනා - අංක 315 ඒ, වේරගල, පයාගල.
4. මුල්ලකන්දගේ චම්පික මනෝජ් කුමාර - අංක 315 ඒ, වේරගල, පයාගල.
5. මුල්ලගේ පියසේන - අංක 315 ඒ, වේරගල, පයාගල.
6. නිශ්ශංක ප්‍රදිප් රුවන් සිල්වා - කටුකුරුන්දගහලන්ද, පොතුවිල, පයාගල
7. කොටදේදුමගේ ශ්‍රියානි - වේරගල, පයාගල
8. පො.කො. 1040 ජයන්ත - පොලිස ස්ථානය, පයාගල
9. පො.කො. 21568 චන්ද්‍රසිරි - පොලිස ස්ථානය, පයාගල
10. බන්ධනාගාර නියාමක ලසන්ත - වැලිකඩ බන්ධනාගාරය,කොළඹ.
11. සහකාර පොලිස් අධිකාරි - එච්.ජේ.එම්. සිදියාන් පොලිස් කාර්යාලය,නාගොඩ,කළුතර
12. සහකාර පොලිස් අධිකාරි අමරසිංහ - සහකාර පොලිස් අධිකාරි කාර්යාලය, මතුගම
13. වෛද්‍ය ඩී.අයි.එල්. රත්නායක - සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි,අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලය, කොළඹ.

Scanned with CamScanner

02 APR 2019

(21.06.2000 දින මුල්ලකන්දගේ ප්‍රසන්න ජගත් කුමාර යන අයගේ මෘත ශරීරය සම්බන්ධයෙන් පවත්වන ලද පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර සාක්ෂි දීමට)

14. කාර්යභාර වෛද්‍ය නිලධාරි - බන්ධනාගාර රෝහල, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ 08.

මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන අයට අදාල 18/06/2000 දින දරණ...බි.එච්.ටි 401/2000 සම්බන්ධව සාක්ෂි දීමට)

15. වෛද්‍ය ඩබ්ලිව්.ආර්. පියසෝම - අධිකරණ වෛද්‍ය නිලධාරි මහ රෝහල, කළුතර.

(17.06.2000 දින අංක 116/2000 දරණ මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කර සාක්ෂිදීමට)

16. පො.ප. අමරරත්න ජයසේකර - පොලිස් ස්ථානය, පයාගල.

17. පො.සැ. 13006 සුනිල් රණතුංග - පොලිස් ස්ථානය, පයාගල.

අත්/කලේ

රජයේ අධිනීතිඥ

වර්ෂ 2018 ක් වූ 02 මස 06 දින.

Scanned with CamScanner

0 2 APR 2019

2013.02.18

නීතිපතිවරයාගේ අංක 1/32/2006 දරණ අධිචෝදනා පත්‍රය, එහි පිටපත් 01ක්, ප්‍රකාශ සටහන් පිටපත් උධෘත පිටපත් එවා ඇත.

1. ගොනු කරන්න.
2. මුල් නඩු වාර්තාව එවා ඇත.
3. 2013/07/25 දිනට පොලිසිය මගින් චූදිතට සිතාසි හා ඇපකරුවන්ට නොතිසි නි/කරන්න.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

2013.07.25

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න

මුල් නඩු වාර්තාව ලැබී ඇත.

චූදිත සිතාසි හැ ඇපකරුවන්ට නොතිසි නිකුත් කර ඇත.

චූදිත ඇප

1. අජිත් අඅමරතුංග - සිටි
2. හටන්ගලගේ විරාජනී - සිටි

පසුව

මෙම නඩුවේ චූදිත 2005 වසරේ සුනාමි ව්‍යසනයෙන් පසුව අතුරුදහන්ව ඇති බව ඔහුගේ බිරිඳ විසින් ප්‍රකාශ කල බවත් චූදිත ඇප නොතිසි හරියාකාරව එහි භාර දුන් බවට ස්ථානාධිපති පයාගල වාර්තා කර ඇත.

චූදිතට නැවත පයාගල පොලිස් ස්ථානාධිපති මගින් සිතාසි වාර්තා.

2013/8/07- අත්/කලේ.

Scanned with CamScanner

0 2 APR 2019
... කළුතර - HIGH COURT KALUTARA



2013/08/07

වුදිතගේ සිතාසි වාර්තාව සම්බන්ධව සලකා බැලීමට.

වුදිත- වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න - නැත.

වුදිත සිතාසි හා අදාල ප්‍රකාශ සටහන් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගෙන අද දින ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට දන්වා අදාල ලිපි පයාගල පොලිස් ස්ථානය වෙත නිකුත් කර ඇත.

අදාල වාර්තා ස්ථානාධිපති, පයාගල මගින් ලැබී නොමැත.

වුදිත ඇ.ස.රෙ. වාර්තාව ලැබී නැත.

පසුව:

මෙම නඩුවේ වුදිත අතුරුදහන් වී ඇති බවට තොරතුරු අනාවරණය වු බවත්

ඒ සම්බන්ධව අදාල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාගෙන් හා ඔහුගේ බිරිඳ මගින් ප්‍රකාශ සටහන් කරගත් බවත්, බිරිඳගේ ප්‍රකාශ සටහන්වලට අනුව බිරිඳ විසින් 2005.01.12 දින කළුතර දකුණ පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලකට අනුව මෙම වුදිත 2005.01.10 දින සිට අතුරුදහන් වී ඇති බවට තොරතුරු අනාවරණය වු බවත්, එහි මුල් ලේඛණ කළුතර දකුණ මුලස්ථාන පොලිසිය භාරයේ ඇති බවත්, සදහන් කරමින් අදාල ප්‍රකාශ සටහන්ද සමග ස්ථානාධිපති, පයාගල සිතාසි වාර්තාව ඉදිරිපත් කර ඇත.

වුදිත විදේශ ගතවී ඇති බවත් වින්දිත පාර්ශවය දන්වයි.

Scanned with CamScanner

02 APR 2019

වුදිත පිළිබඳව ඔහු විදේශ ගතවී ඇත්ද යන්න සොයා බලා ඔහු විදේශගත නම් ඔහු පිළිබඳ පරීක්ෂණයක් පවත්වා සොයා බලා වාර්තා කරන ලෙසට කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තැනට සහ පොලිස් මූලස්ථානයේ නියෝජ්‍ය පොලිස් පති තැනටද නියෝග කරමි. එම නියෝගය දන්වන්න. වින්දිත පාර්ශවය වුදිත විදේශගත බව දන්වන නිසා වුදිතට වරෙන්තු නිකුත් කරමි. වුදිතගේ වරෙන්තුවේ පිටපතක් පොලිස් මූලස්ථානයේ නියෝජ්‍ය පොලිස්පති මගින් සහ කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මගින්ද නිකුත් කරන්න. අ.න.වි.ස 241(1) පියවර සදහා අඩගසන්න.

2013/10/09

අත්/කලේ

<u>2013.10.09</u>

අ.න.වි.ස 241(1) පියවර සදහා නියමිතය.

වුදිත: වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න - නැත.

වුදිත වරෙන්තු නියෝජ්‍ය පොලිස්පති, පොලිස් මූලස්ථානය මගින් හා කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මගින්ද නිකුත් කර ඇත.

මෙම නඩුවේ වුදිත විදේශ ගතවී ඇත්ද යන්න සොයා බලා විදේශ ගත වී ඇත්නම් වුදිත සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වාර්තා කරන ලෙසට නි.පො.ප. පොලිස් මූලස්ථානය හා කළුතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තැනට නියම කර ඇත.

Scanned with CamScanner

0 2 APR 2019



වාර්තා නියමිතයි.

(අදාල වාර්තා ලැබී ඇත)

<u>පසුව</u>

මෙම නඩුවේ වරෙන්තු කරු වන වුදිත දැනට වසර 8 පමණ ඉහත දි අදාල ලිපිනයේ පදිංචිව සිට දැනට එහි පදිංචිය හැරගොස් ඇති බවත් විදේශ ගත වී ඇත්ද යන්න සොයා බැලීමේදී වුදිත විදේශ ගත වී නොමැති බවට තොරතුරු අනාවරණය වූ බවත්, තවදුරටත් විමර්ශණය කිරීමේදි මෙම වුදිත දැනට ප්‍රදේශයෙන් සැඟවී පොලිසිය මගහරිමින් සිටින බවත්, ඒ සම්බන්ධව වුදිතගේ බිරිඳගේන් විමසීමේදී මෙම වුදිත 2005.01.10 දින ඔහුගේ මවගේ නිවසට පිටව යන බව පවසා නිවසින් බැහැරව ගොස් ඇති බවත්, ඉන්පසුව මොහු පිළිබඳව තොරතුරක් දැන ගැනිමට නොහැකි වූ බැවින් 20005.01.11 දින කළුතර දකුණ පොලිසියට වුදිතගේ අතුරුදහන් විම පිළබඳව පැමිණිල්ලක් කර ඇති බව ප්‍රකාශ කල බව සඳහන් කරමින් , මේ සම්බන්ධව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිනියගේ හා වුදිතගේ බිරිඳගෙන් ලබාගත් ප්‍රකාශ සටහන්ද ඉදිරිපත් කරමින් මු.ප්‍ර.පො.ප කළුතර දකුණ වරෙන්තු වාර්තාව ඉදිරිපත් කර ඇත.

අ.න.වි.ස 241(1) යටතේ සාක්ෂි ලැයිස්තුවේ සඳහන් සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරන්න.

Scanned with CamScanner

02 APR 2019



අ.න.වි.ස 241 විමසීම

2014/2/10

චූදිතගේ ඇපකරුවන්ට නොතිසි.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

<u>අ.න.වි.ස 241 විමසීම</u>

<u>2014.2.10</u>

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න -නැත

චූදිතගේ 1 සහ 2 ඇපකරුවන්ට නොතිසි නිකුත් කර ඇත.

2005/3/22 දින එම ඇප මුදල් රාජසන්තක කර ඇත.

2005/3/31 දින එම දඩ මුදල් ගෙවා ඇත.

(චූදිත ඇප තබා ඇත්තේ මහේස්ත්‍රාත් අධිකරණයේ පමණි).

ඉහත චූදිතගේ මහේස්ත්‍රාත් අධිකරණයේ ඇප රාජසන්තක කරන ලද ඇපකරුවන්ටද නොතිසි නිකුත් කර ඇත.

Scanned with CamScanner

0 2 APR 2019
HIGH COURT KALUTARA



1. අජිත් අමරතුංග

11. හටන්ගලගේ විරාජිනී සුගන්ධිකා පෙරේරා

අ.න.වි.ස 241(1) යටතේ විමසීමට අදාලව සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කර ඇත.

සාක්ෂි: 1. මනතුංගලේ දෝන මාලිකා නිල්මිණී අබේරත්න

11. හටන්ගලගේ විරාජිනී සුගන්දිකා පෙර්රා

111. පො.සැ. 56222 නන්දසිරි

1,11,111 සාක්ෂිකරුවන්ට -

සිතාසි භාරදුන් බවට ස්/පති - පයාගල වාර්තා කර ඇත.

අ.න.වි.ස පනතේ 241 වන වග. පරිදි ක්‍රියා කරමින් රජයේ අධි නිතිඥවරිය සාක්ෂි මෙහෙයවන ලදී.

චූදිත නොමැතිව නඩු විභාගය පවත්වාගෙන යාමට අ.න.වි.ස. පනතේ 241(1) (ආ) වග. යටතේ තීරණය කරමි.

විභාගයට දිනයක් නියම කිරිමට කැදවන්න.

2014/07/03

සටහන් බලන්න.

Scanned with CamScanner

02 APR 2019
COURT KALUTARA



2014/07/03

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) නැත
(2014/2/10 ජාමීන් පවසමින් ඇත).

විභාගයට දින නියම කිරිම සඳහා

කැඳවා ඇත.

පැ.සා. 1,2 ට සිතාසි

නිකුත් කරන්න.

විභාගය 2015/02/10

සටහන් බලන්න

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

2015/2/10

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241)

(2014/2/10)

පැ.සා 1 සහ 2 සිතාසි නිකුත් කර ඇත.

පැ.සා.1 සිටී. අවවාද.

විභාගය 2015/10/07

සටහන් බලන්න.

අත්/කලේ - මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019
COURT KALUTARA



2015/10/7 - විභාගය 2 ,

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) නැත.

(2014/02/10)

පැ.සා. 1 අවවාද කර ඇත.

පැ.සා. 1,2 සිටී.

පැ.සා.1,2 අවවාද.

විභාගය

1/3/2016

අත්/කලේ.

01/03/2016 විභාගය (3)

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) x

පැ.සා. 1,2 අවවාද මත සිටී.

චූදිත වරෙන්තු

පැ.සා. අවවාද

ආගමන විගමන පාලකට ලිපියක් නිකුත් කරන්න.

වාර්තා 2016.06.23

අත්/කලේ- මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019
COURT KALUTARA



23/6/2016

වූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) x

පැ.සා. 1,2 අවවාද මත සිටී.

වා.ඉ/කිරිම සදහා ආගමන විගමන පාලකට නොතිසි නි/කර ඇත.

අද දින වා. කැදවීමට නියමිතයි.

වූ/ගේ අ.වා.ඇත.

පැ.සා. 1 සිටී.

මහාධිකරණ විනිසුරුතුමා නිවාඩු බැවින් 2016.09.07 දිනට කැදවන්න.

2016/09/05

මෙම නඩුවේ වූදිත සම්බන්ධයෙන් 2016.03.01 දිනැති නියෝගය පරිදි ආගමන විගමන දෙපාර්තමේන්තුවට නිකුත් කරන ලද නියෝගයට අනුව මෙම වූදිතගේ ජාතික හැදුනුම්පත් අංකයක් හෝ විදේශ ගමන් බලපත්‍ර අංකයක් නොමැතිව නිවැරදිව තොරතුරක් ලබාගත නොහැකි බවට ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් දැනුම් දී ඇත.

02. ස්ථානාධිපති,පොලිස් ස්ථානය, පයාගල මගින් මෙම වූදිතගේ බිරිදගෙන් හා අදාළ ග්‍රාම නිලධාරි වරයාගේ ප්‍රකාශද සටහන් කර වාර්තාවක් ගොනු කර ඉදිරිපත් කර ඇත.

01. ගොනු කරන්න.

02. නියෝගය

Scanned with CamScanner

0 2 APR 2019



චූදිතගේ ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කිරිමට පොලිස් ස්ථානාධිපතිට නොතිසි නි/කරන්න.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

<u>07/09/2016</u>

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) x

පසුගියදින පැ.සා.1 අධි.යේ පෙනී සිට ඇත.

චූ/ගේ ජා.හැ.අංකය ඉ/කිරීමට පයාගල පොලිසියේ ස්ථානාධිපතිට නො.නි.කර ඇත.

පසුව

පයාගල පොලිසියේ ස්ථානාධිපති විසින් චූ/ගේ ජා.හැ.අංකය හා විදේශ ගමන් බලපත්‍ර අංක සදහන් ... ඉ/කර ඇත.

ලේඛණ ගොනු කරයි.

ස්ථානාධිපති මුදා හරින ලදි.

කැදවන්න

2016/09/20

අත්/කලේ - මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019



20/9/2016

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241) x

-චූදිත ආගමනයේදී හෝ විගමනයේදී අත්අඩංගුවට ගෙන ඉ/කරන ලෙසට දන්වා ආගමන විගමන පාලක වෙතට ලිපියයක් ගොනුකොට ඇත.

සටහන් බලන්න.

පරිගනක දත්ත වාර්තාව ඉදිරිපත් කරන්න.

කැඳවන්න.

2017/01/11

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

2016/10/03

පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනිතිඥ තුමිය ලිපියක් ඉදිරිපත් කරමින් මෙම නඩුවට අදාල විශේෂිත වු කරුණු ඉදිරිපත් කිරිම සඳහා මෙම නඩුව 2016.10.04 දින විවෘත අධිකරණයේ කැඳවන මෙන් ඉල්ලා සිටි.

1. ගොනු කරන්න.

2. ඉල්ලීම පිළිබද නියෝගය :

කැඳවන්න.

අත්/කලේ

මහාධි/විනිසුරු.

04/10/2016

රජයේ අධිනිතිඥ මියගේ ඉල්ලිම අනුව අද දික කැඳවන ලදී.

2017/01/11 කැඳවීමට නියමිතයි.

සංශෝධන සාක්ෂි ලැයිස්තුව ගොනු කරයි.

Scanned with CamScanner

02 APR 2019



පැ.සා. 1,13,18,19,3,21,14,10,12,22

පැ.සා. 1, 13,18

සටහන් අනුව සිතාසි නි/කරන්න.

විභාගය

2016.11.22,23, 24

අත්/කලේ

මහාධිකරණ විනිසුරු

2016/10/12

නි/අනුෂා අල්විස් මිය මෝෂමක් ඉදිරිපත් කරමින් මෙම නඩුවේ පහත දැක්වෙන ලේඛණ වල ජායා පිටපතක් නියමිත ගාස්තු අයකරගෙන ලබාදෙන මෙන් ඉල්ලා සිටී.

- අධිචෝදනා පත්‍රය සහ ඇමුණුම්
- 2015.02.10 දිනෙන් පසු සටහන්
- ආගමන විගමන පාලක විසින් එවන ලද පිලිතුරු ලිපිය

1. ගොනු කරන්න
2. ඉල්ලීම පිලිබඳ නියෝගය:-

නිකුත් කරන්න.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

2016/10/13

පයාගල පොලිස් ස්ථානාධිපති මගින් මෙම නඩුවේ චුදිත වන ප්‍රසන්න වික්‍රමරත්න යන අයගේ අංක එන් 1314152 දරණ විදේශ ගමන් බලපත්‍රයට අදාල පරිගනක දත්ත වාර්තාව පො.සැ.25386 නලින් නිලධාරියා යොදවා ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඉදිරිපත් කර ඇත.

1. ගොනු කරන්න.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019



2016/10/18

පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥතුමිය සාක්ෂි ලැයිස්තුව සංශෝධනය කර සාක්ෂි ලැයිස්තුවක් ඉ/කරමින් සිතාසි නිකුත් කරන ලෙස ඉල්ලා සිටී.

1. ගොනු කරන්න.

11. නියෝගය

නිකුත් කරන්න.

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

2016/11/22 විභාගය (4)

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241 (1) x

2017/01/11 දින අවලංගුකර ඇත.

අද දින පැ.සා.1,13,18 කැඳවීම සි/නි කර ඇත.

ඉ/දිනය 11/23, 24

චූ/ගේ පරිගනක දත්ත වාර්තාව ආගමන විගමන පාලක මගින් පයාගල පොලිසිය විසින් ලබාගෙන ඉ/කර ඇත.

Scanned with CamScanner

02 APR 2019



2016/11/23 විභාගය (5)

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241)x

පැ.සා.18 අවවාද මත සිටී.

පැ.සා.15 කැඳවීම භාරගෙන ඇත.

අද දින පැ.සා.3.19,21 කැඳවීම නි.කර ඇත.

ඉ/දිනය 11/24

සටහන් බලන්න.

පැ.සා.18 තාවකාලිකව මුදා හරින ලදී.

කොටසක් විභාග කරන ලදී.

පැ.සා. 21 අවසන්.

වැ/විභාගය

2016.11.24

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019



24/11/2016

විභාගය (6)

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241 (1) x

අද දින පැ.සා. 12,14,20,22 කැඳවීමට නියමිතයි.

පැ.සා. 22 මියගොස් ඇති බැවින් පැ.සා 10 ට සි.නිකුත් කර ඇත. පැ.සා.10ගේ සිතාසියේ සම්පූර්ණ නම සඳහන් කර නොමැති බැවින් භාරගැනිම ප්‍රතික්ෂේප කර ඇත.

පැ.සා. 12,14,20 සි. බාරදී ඇත.

පැ.සා. 14,20 අපහසුතාවයන් දන්වා ලිපි එවා ඇත.

පැ.සා.1,2 සිටී. අවවාද.

වැ/විභාගය

2017/03/15

අත්/කලේ.

මහාධිකරණ විනිසුරු.

01/12/2016

රජයේ අධිනිතිඥ මියගේ මෝෂම අනුව කැඳවන ලදී.

ඉ/දින- වැ/විභාගය 2017/03/15

Scanned with CamScanner

0 2 APR 2019



පැ.1 සහ පැ.2 දරණ ලේඛණ මහේස්ත්‍රාත් අධිකරණයෙන් වහාම කැඳවන්න

(සේප්පුගත බව දන්වයි.)

ලිඛිත වාර්තා ද මහේස්ත්‍රත්/මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ගෙන් කැඳවන්න.

(වුදිත පෙනී සිටීමඅවශ්‍යනැත.)

2017/01/18

අත්/කලේ

මහාධිකරණ විනිසුරු.

18.01.2019

වුදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241 (1) x

රෙජිස්ට්‍රාර් මහේස්ත්‍රාත් අධිකරණය, කළුතර විසින් පැ.සා.1 ලේඛණ එවා ඇත. පැ.සා.2 වශයෙන් වෙනම ලේඛණයක් භාරදී නොමැති බවත්, සොයා බලා වාර්තා කිරිමට දින අයද ඇත.

පැ. සා. මුද්‍රා හරිම ලදී.

වැ/විභාගය 2017/03/15

පැ. 2 නොමැත.

කැඳවන්න.

2017/3/15 -අත්/කලේ

Scanned with CamScanner

02 APR 2019



15/3/2017 වැ/විභාගය (7)

චූදිත - වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241 (1) ) x

එම ලේඛණ මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජි. විසින් එවා ඇත.

පැ.සා. 1,3,21 අවසන්.

~~පැ~~

පැ. සා. 2 නැත.

සිතාසි නිකුත් කරන්න.

වැ/විභාගය

2017/7/4

අත්/කලේ

මහාධිකරණ විනිසුරු

Scanned with CamScanner

02 APR 2019
COURT

<u>2017.07.04</u> - <u>වැ/විභාගය 8</u>

චූ / වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241(1))

-පැසා 2 සිතාසිය භාර දී ඇත.

සටහන් බලන්න.

කොටසක් විභා. ගන්නා ලදී.

පැසා 4 සිතාසි නි/ක.

වැ/විභා - 2017.08.28

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

<u>2017.08.28</u> - <u>වැ/විභාගය</u> (9)

චූ/වල්පොල ගෙදර ප්‍රසන්න වික්‍රමරත්න (241(1))

-පැසා 4 ගේ සිතාසිය ලි.ප.තැ. මගින් යවා ඇති බවට

පයාගල පොලීසිය විසින් වා. ඉ/කර ඇත.

සටහන් බලන්න.

කොටසක් විභාග කරන ලදී.

චූදිත විදේශගත යන්න පිළිබඳ වාර්තාවක්

ආගමන විගමන පාලක මගින් කැඳවන්න.

පැ.සා 13 සිතාසි නිකුත් කරන්න.

වැ/විභා - 2017.12.07

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

02 APR 2019

2017.08.30

කළුතර දිසා අධිකරණ නඩු අංක එම්.ආර්. 4781 දරණ නඩුව සඳහා 2017.08.31 දිනට මෙම නඩුව ඉදිරිපත් කර සාක්ෂි දීමට කළුතර මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත සිතාසි කර ඇත.

1.) නඩු වාර්තාව කළුතර දිසා අධිකරණය වෙත ඉදිරිපත් කර සාක්ෂි දීම සඳහා අවසරය පතමි.

නියෝගය :

අවසර දෙනු ලැබේ.

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

2017.12.07 - වැ/විභාගය 10

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

-පැසා 13 අධි.වෛ.නි විශ්‍රාමගොස් ඇති බවත් පැසා 13 ගේ සිතාසි පොලිස් මුරපොල මගින් නි/කර ඇති බවට වා/ඇත.

-චූ/ විදේශගතව සිට 2009.03.08 වන දින දිවයිනට පැමිණ ඇති බවත්, නැවතත් ~~සඳහන් විදේශ ගමන් බලපත්‍රය~~ විදේශගත වී නොමැති බවට ආගමන විගමන පාලක විසින් වා.එවා ඇත.

-පැසා 13 එච්.ජේ.එම්.එච්.රත්නායක x

පැසා 13 නැත - නැවත සිතාසි නි/කරන්න.

චූදිත වරෙන්තු ඇප නොතිසි.

2018.04.27

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

0 2 APR 2019
COURT

2018.04.27 - වැ/විභාගය 11

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

මත සිටී
-චූ/වරෙන්තු (~~අපැහැදිලි නැකක්~~) වා නැත.

-චූ/ මෙම අධි.යේ මෙතෙක් පෙනීසිට නොමැත.

-චූ/ ගේ මහෙස්ත්‍රාත් අධි.යේ පු.ඇපකරුවන්ට නො.

භාරදී ඇත.

-2005.03.22 වන දින මහේ.අධියේදී පු.ඇපකරුවන්

දෙදෙනාගේ මු. ඇප දඩයක් ලෙස අයකරගෙන ඇත.

-මහේ.අධි.යේ පු.ඇපකරුවන්

1. අජිත් අමරතුංග ✓
2. හටන්ගලගේ විරාජනි සුගන්ධිකා පෙරේරා X මළා.

-පැසා 13 ට සි.නි. කිරීමට නි.කර ඇතත් අතපසුවීමකින්

සි.නි.කර ඇත.

පසුව,

-චූ/ගේ ව.වා.ඇත.

වැ-විභාගය -2018.07.03

අත්.කලේ

2018.07.03 - වැ/විභාගය (12)

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

-චූදිත වරෙන්තු මත සිටී - වාර්තා නැත.

-චූදිත මෙතෙක් මෙම අධිකරණයේ පෙනී සිට නොමැත.

-චූදිතගේ මහෙස්ත්‍රාත් අධිකරණය පු.ඇපකරුවන්ට

නොතිසි භාර දී ඇත.

-2005.03.22 දින මහෙස්ත්‍රාත් අධිකරණයේ දී

Scanned with CamScanner

පූ.ඇපකරුවන් දෙදෙනාගේ ඇප දඩයක් ලෙස

අයකරගෙන ඇත.

-මහේ.අධිකරණයේ පූ.ඇපකරුවන්

1. අජිත් සමරතුංග

2. හටන්ගලගේ විරාජිනි සුගන්ධිකා පෙරේරා.

02 APR 2019
H... COURT KALUTA...

-පැසා 13 සිතාසි නිකුත් කර ඇත.

පැසා 13 වෛද්‍ය [illegible] දැනට විශ්‍රාම ගොස් ඇති

බැවින් පොලිස් මෘත ශරීරාගාරය, අධිකරණ වෛද්‍ය

නිලධාරි කාර්යාලය, කොළඹ. පොලිස් මුරපොල,

පො.කො. 35093 විතාන නිලධාරියාට එම සිතාසිය

භාර දී ඇති බවත්, පැසා 13 වෛද්‍ය නිලධාරිණියට

2018.07.03 දින අධි.ඉදිරියේ පෙනී සිටි බව දන්වා

ඇති බවත් ස්ථානාධිපති පයාගලට ගොනු කර ඇත.

පැ.සා 13 වෛද්‍ය එච්.ජේ.එම්.ජේ. රත්නායක

-ස්ථානාධිපති පයාගල විසින් වරෙන්තු වාර්තා ගොනු

කර ඇත.

ඇපකරුවන්ගේ ඇප මුදල් රාජසන්තක

නොකිරීමට හේතු ඉ.දින ඉදි.කල යුතුය.

පැසා 13 සිතාසි.

(සටහන් බලන්න.)

2. ඇපකාරිය සිටී. අවවාද.

1. ඇපකරු ඉ.දින ඉ.කිරීමට නි.ජයනෙත්ති මයා බාරගනී.

වැ/වි සහ ඇප මුදල් රාජසන්තක නොකිරීමට

හේතු ඉදි.කිරීම - 06/09/18

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

2018.09.06 - වැ/විභාගය 13

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

-පැ.ස 13 නැ/සි/නි/කර ඇත. බාර දුන් බවට

වා/ඉ/කර ඇත.

පැසා 13 - වෛද එච්.ජේ.එම්.ජේ.රත්නායක මිය

-චූ/ගේ 1 වන ඇපකාරිය අවවාද මත සිටී.

02 ඇ/කාරිය - හටන්ගලගේ විරාජිනි සුගන්ධිකා පෙරේරා

-1 ඇපකරු අද දින ඉ/කිරීමට නියමිතයි.

(නීතිඥ විරාජ් ජයනෙත්ති මහතා මගින්)

-ඇ/කරුවන්ගේ ඇප මුදල් රාජසන්තක නොකිරීම පිළිබඳ

කරුණු දැක්වීමට නියමිතයි.

ඇපකරුවන් දෙදෙනාම සිටී.

(සටහන් බලන්න.)

1 වන ඇපකරු විසින් අත්සන් කර ඇති ඇප මුදල

රාජසන්තක කර ඇති බව තහවුරු කිරීමට ලේඛනයක්

ඉදි.කරයි. ගො/ක.

පැසා 13 නැවත සිතාසි.

වැ/විභා - 10/12/18

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

02 APR 2019
COURT

Scanned with CamScanner

-27-

6

0 2 APR 2019

2018.12.10 - වැ/විභාගය 14

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

පැසා 13 ට සි/නි කර ඇත.

පැසා 13 වන අධිකරණ වෛද්‍ය නිළධාරි තුමිය විශ්‍රාම

ගොස් ඇති බවත්, වෛද්‍ය තුමියගේ නමෙහි මුලකුරු

වැරදි බවත් ඩී.අයි.එල්.රත්නායක යනුවෙන් නිවැරදි

විය යුතු බවත් ඒ අනුව ඒ නමට සිතාසි නි/කරන

ලෙසත් පොලිස් මුරපොලේ නිලධාරියා විසින් දැනුම්

දුන් බවත් දන්වා වාර්තාව ඉ/පත් කරයි.

චූ/ගේ ඇප - 1. අජිත් සමරතුංග x

2. හටන්ගලගේ විරාජිනී සුගන්ධිකා පෙරේරා √

(සටහන් බලන්න)

පැසා 13 වන ඩී.අයි.එල්.රත්නායක සහ

අධි.වෛද්‍ය නිලධාරි, වෛද්‍ය නිලධාරි කාර්යාලය,

කොළඹ ට සිතාසි නි/ක.

2 ඇපකාරිය සම්බන්ධයෙන් ඉල්ලීමක් කරයි.

2 ඇපකාරිය මුදා හරිමි.

අදාළ මහේ.අධි නඩු වාර්තාවේ සහතික පිටපතක්

ගොනු කරයි.

වැ/වි - 12/03/19

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

HIGH COURT KALUTARA
02 APR 2019

2019.03.12 - වැ/විභාගය 15

චූ/වල්පොල ප්‍රසන්න වික්‍රමරත්න - 241(1) x

-පැසා 13 ට සි/නි කර ඇත.

පැසා 13 දැනට විශ්‍රාම ගොස් ඇති බැවින් සිතාසිය

ලි.ප.තැ මගින් යොමු කර දූරකථන අංකයට දූරකථන

ඇමතුමක් ලබා දුන් බවට වාර්තා ඉ/පත් කරයි.

පැසා 13 - ඩී.අයි.එල්. රත්නායක මියෑ√

සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි කොළඹ

පැසා 13 කැඳවයි.

පැසා 13 අවසන්.

පැසා 14 සිතාසි.

වැ/විභාගය - 2019.05.07

අත්.කලේ

මහාධිකරණ විනිසුරු.

Scanned with CamScanner

කළුතර මහෙස්ත්‍රාත් ටී.ජී.එස්.ජී.පෙරේරා මහතා ඉදිරියේදී.

2003.06.26

නඩු අංකය : එන්.එස්. 46635

වි/කරු සිටී.

පෙනී සිටී. වි/කරුට නී.කණිෂ්ක මහතා සමඟ බෙවින් කුමාර සිටී මහතා සමඟ වි/වෙනුවෙන් නී.ඇල්ලෙ පොල මහතා සහ නී.විරාජ් ජයනෙත්ති මහතා පෙනී සිටී. පැමි. ර.නී. පාතිමා මහත්මිය සමඟ එන්.ආර්.අබේ ~~(අපැහැදිලි තැනක්)~~ මහතා පෙනී සිටී. අතෘප්තියට පත් පාර්ශවය වෙනුවෙන් ප්‍රියන්ත ගමගේ මහතා පෙනී සිටී.

අ.ප.න.වි. සංග්‍රහයේ 146 වගන්තිය යටතේ වි/කරුට චෝදනාව කියවා පහදා දෙන ලදී. නම : මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති, සහතික කර කියා සිටී. වයස අවු. 34 යි. ලිපිනය, 315/ඒ වේරගල පයාගල. රැකියාව සම්බන්ධීකරණය නිළධාරී මානව හිමිකම් ආයතනයේ ජන සංසදනයේ සම්බන්ධීකරණ නිළධාරී.

මා විවාහකයි. ඔබ වර්තමානයේ පදිංචි ලිපිනයේද ඉන්නේ. ඔව්. සහෝදරයන් මට හතර දෙනෙක් ඉන්නවා. ඒ සහෝදරයන්ගේ නම් වශයෙන් 1. රෝහාන් දිලිප්කුමාර 2. තුෂාන් අමරජිත් පද්මකුමාර 3. ලසන්ත ජගත් කුමාර. (මියගිය ජගත් කුමාරයි) 4. චම්පික මනෝජ් කුමාරයි. සහෝදරයින් අතුරෙන් එක සහෝදරයෙක් මියගොස් ඇති බව. ඒ මියගිය සහෝදරයාගේ නම ලසන්ත ජගත් කුමාරයි. ලසන්ත ජගත් කුමාර මියයන විට ඒ කාලවකවානුවේ පදිංචි වෙලා සිටියේ ඔහුගේ බිරිඳගේ නිවසේයි. ඒ සහෝදරයාගේ බිරිඳගේ නම තොටබදුගේ ශ්‍රියානි සිල්වාය. මේ ශ්‍රියානි සිල්වා කියන තැනැත්තියත් අද ගරු අධිකරණයට ඇවිල්ලා නැහැ. එයත් සාක්ෂිකාරියක්. තමාගේ සහෝදරයා නිවසේ භාර්යාවට අමතරව ඇයගේ මවත් ඇයගේ මල්ලිත් ආච්චි අම්මා කෙනෙක් ඉන්නවා. මේ සිද්ධිය වන වකවානුවේ මාගේ පියා ජීවතුන් අතර සිටියා. තාත්තාගේ නම මුලකන්දගේ පියසේනයි. මවගේ නම පොඩි නෝනයි. පොඩි නෝනා මේ කුඩුවේ සාක්ෂිකාරියක්ය. අද අධිකරණයට පැමිණියේ නැත. මියගිය සහෝදරයා යම්කිසි රැකියාවක් කලා. යුධ හමුදාවේ සේවය කලා. ඊට පස්සේ වෙළදාම් කටයුතු කලා. වෙළදාම් කලේ ගම් ප්‍රදේශයේ සහ පොලවල් වලය. මියයන විට යුධ හමුදාවෙන් අයින් වෙලා මාස යුධ හමුදාවෙන් අයින් වුනේ 1999 ජනවාරි වලයි. මාගේ සහෝදරයා මියගිය කාලයේ මා රැකියාවක් කලා. මා රැකියාව කලේ හෙට්ටිගොඩ පුද්ගලික සමාගමකයි. ඒ රැකියාව කරපු ස්ථානයට මා දිනපතාම ගෙදර ඉදලා ගමන් කලා. මා රැකියාව සඳහා 6.10 ට පමණ පිටත් වෙලා රෑ 8.00 ත් 8.හමාරත් විතර වෙනවා. මියයන විට සොහොයුරා කොච්චර කාලයක් වෙනවා. මා විවාහ වුනේ 1997 ජූනි මාසයේ 23 වන දිනයි. ජගත් කුමාර කියන මාගේ මියගිය සහෝදරයා සම්බන්ධයෙන් යම්කිසි විශේෂය සිද්ධියක් වුනා දන්නවා. මා සහෝදරයා

Scanned with CamScanner

02 APR 2019
HIGH COURT KALUTARA

අවසාන වතාවට දැක්කේ 2000 06 වන මාසේ 17 වන දිනයි. කළුතර බන්ධනාගාරයේදී ය. ඒ සහෝදරයා සම්බන්ධයෙන් යම්කිසි විශේෂ තොරතුරක් වශයෙන් 2000.06.12 වන රැකියාවට ගොස් ආපසු එනවිට වේලාව රාත්‍රී 8.00 ට පමණ ඇති. ඒ අවස්ථාවේදී යම් තොරතුරක් දැන ගන්නට ලැබුනා. ඒ කුමක්ද යන්නෙන් මල්ලි පයාගල පොලිස් අත් අඩංගුවේ සිටින බව. ජගත් කුමාර කියන මල්ලි ගැන තමයි දැන ගන්නට ලැබුනේ. ඒ තොරතුරු ලබා දුන්නේ මල්ලිගේ යාලුවෙක් වන අජන්තයි. මාගේ සහෝදරයා පොලිස් අත් අඩංගුවේ සිටින බව දැන ගන්නට ලැබුණු මුල්ම තොරතුරු තමයි ඔය යාළුවා කිවූ තොරතුර. එය ලැබුන පස්සේ මා ගත් මුල් පියවර වන්නේ ඒ අවස්ථාවේදී ඔහු පොලීසියට යන්න කතා කලා. මට පොලීසියට යන්න කතා කලා අජන්ත සමඟ පොලිසියට ගියේ නැහැ. මේ තොරතුරු සම්බන්ධයෙන් ගෙදර ගිහිල්ලා යනවිට මවත් සහෝදරයන් දෙදෙනෙක් සිටියේ නැහැ. ඔවුන් සමඟ කතා කලා යාළුවෙක් මාර්ගයෙන් තමයි තොරතුරු ලැබුනේ. පවුලේ උදවිය සමඟ සාකච්ඡා කලා. මා මේ සම්බන්ධයෙන් අම්මා සමඟ කතා කලා. මේ නඩුවේ සාක්ෂිකාරියක්ය. අම්මා මට කීවා උදේ සුමතිපාල ඇවිල්ලා කිව්වා කියලා මල්ලි එයා කීවා කියලා මල්ලිව පොලීසියෙන් ගෙනිච්චා අම්මාට පණිවුඩය කියන්න කියලා. අම්මා ලත් තොරතුරක් සම්බන්ධයෙන් මට කීවා. අම්මා සමඟ රෑ ගියේ නැහැ. පොලීසියට නොගියේ වැඩිමහල් සහෝදරයන් දෙදෙනා කීවා යන්න එපා කියලා. ඔහු විවාහ වෙලා සිටිය බිරිඳගේ ගෙදරට යන්න එපා කියලා කීව නිසා ඒ අය එන්නේ නැහැ. එදා රාත්‍රියේ මා ගෙදරගත කලා. ජුනි 12 වනදා පසුවදා පොලීසියට ගියා. පහුවදා උදේ මා පොලීසියට ගියේ නැහැ. අම්මා අඩ ගැසුවා පොලීසියට ගිහිල්ලා මල්ලි බලන්න කියලා. මම උදේ රාජකාරියට යන ගමන් වැඩිමල් සහෝදරියගේ ගෙදර තිබෙන්නේ මොරටුවේ එහේ ගිහිල්ලා මල්ලි අත් අඩංගුවට ගත්තා කියලා කීවා. ඇයට පොලිස් ස්ථානයට යන්න කියලා ඉල්ලීමක් කලා. එම සහෝදරියගේ නම මුලකන්දගේ දීපිකා ජයන්තියි. ඒ අයත් මේ නඩුවේ සාක්ෂිකාරියක්. යම්කිසි තොරතුරක් මාගේ සහෝදරයාගේ සම්බන්ධයෙන් සැපයුවා. සහෝදරයා අත්අඩංගුවට පත් දිනයේ සේවා ස්ථානයෙන් ආපසු ආවේ 9.00 ට විතරයි. මා මේ සිද්ධිය සම්බන්ධයෙන් අම්මා සමඟ සාකච්ඡා කලා. ඒ අවස්ථාවේදී යම් තොරතුරක් දැන ගන්නට ලැබුනා. ඒ තොරතුරු මා හට දැන ගත්තේ අම්මා ගෙන්ය. අම්මා කීවා උදේ පයාගල පොලීසියට ගියා මල්ලි පෙන්නුවේ නැහැ ගෙනිච්ච කෑම එක විතරක් ගත්තා. ආමි එකට දන්වලා තිබෙන්නේ ඒකට මල්ලිව බාර දෙනවා කියලා කීවා. ඒවගේම ආයිත් අම්මා සවසත් පොලීසියට ගියා. මාගේ අම්මා පයාගල පොලිස් ස්ථානයටයි ගියේ. දෙවන වතාවට අම්මා පොලීසියට ගිය අවස්ථාවේදී මාගේ සහෝදරයා සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත්තා. ඒ අවස්ථාවේදී අම්මාට මල්ලිව බලන්න දුන්නා කීවා. මල්ලි කතා කලා. කීවා. මල්ලිට ගැහුවා කීවා. අදත් ගහයි කීවා. ඒක නිසා යුධ හමුදා පොලීසියට ගිහිල්ලා එයාලට කියන්න කියලා කීවා. 13 වනදා මා පොලීසියට ගියේ නැහැ. එදත් හමුවුනේ නැහැ සහෝදරයා. ඊට පස්සේ ඊට පසුවදා 14 දින මා සහෝදරයාට උපකාර කිරීම සඳහා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්තා. අක්කාට ලියුමක් ලිව්වා. දීපිකා ජයන්ති කියන අක්කාට තමයි ලිපිය ලිවේ. එයා මොරටුවේ පදිංචි වෙලා ඉන්නේ. අක්කාට ලිපිය ලීවේ අම්මා

Scanned with CamScanner

0 2 APR 2019

කියලා තිබෙනවා එයාට පොලිසියෙන් ගහනවා කියලා ඇවිල්ලා මල්ලි බලන්න ගියාම මල්ලි කියලා තිබෙනවා එයාට පොලිසියෙන් ගහනවා කියලා ඇවිල්ලා මල්ලිව හමුවෙන්න කියලා ලිපිය ලියලා චම්පික මනෝජ් කුමාරට කිව්වා අක්කා හමුවෙලා මල්ලිව හමුවෙන්න කියලා ලිපිය ලියලා චම්පික මනෝජ් කුමාරට කිව්වා අක්කා එගොඩඋයන විද්‍යාලයේ සේවය මෙකාලෙදි කරන්න කියලා කීවා. ඒ කාලයේ මාගේ අක්කා එගොඩඋයන විද්‍යාලයේ සේවය කරන්නේ. මොරටුවෙමයි තිබෙන්නේ. මා මාගේ සේවා ස්ථානයට 14 වන දින මා සේවය හමාර කරලා රැකියා ස්ථානයෙන් පිටවූ වාට පස්සේ ගෙදර එන්න කලින් මොරටුවේ අක්කාගේ නිවසට ගියා. දීපිකා ජයන්ති කියන අක්කාගේ ගෙදරට ගියා. අක්කා ගෙදර සිටියා. අක්කා සමග කතාකලා. අක්කාගෙන් මා යම්කරුණක් සම්බන්ධයෙන් විමසා සිටියා. මල්ලි බලන්න පොලිසියට ගියාද මොකද වුනේ කියලා ඇහුවා. අක්කා කීවා මල්ලි එක්ක පයාගල පොලිසියට ගියා මල්ලිව පෙන්නුවේ නැහැ ඊටපසුව අපි නාරාහේන්පිට යුධ හමුදා පොලීසියට ගියා. ගිහින් ඔවුන්ට පැමිණිලි කලා. මල්ලි යුධ හමුදාවෙන් පැන ආ වරද මත පොලීසියෙන් අත් අඩංගුවට ගෙන 12 වන දින සිට ඔහුට එහේ පොලිස් නිලධාරින් පහර දෙනවා මව විමසූ විටදී යුධ හමුදා පොලිසියට දන්වා ඔවුන් ආවහම බාර දෙන බවත් කියා සිටිනවා. අද උදේ අපි පොලිසියට ගියාම මල්ලිව පෙන්නුවේ නැහැ කියලා කීවා. ඒ අනුව මා දැන ගත්තා තමාගේ සහෝදරිය පොලිසියට ගිය බව දැන ගත්තා. නාරාහේන්පිට යුධ හමුදා කඳවුරට ගිය බව දැන ගත්තා. 14 වනදා මා පොලිසියට ගියේ නැහැ. මාගේ අක්කා මුණ ගැහැලා ගෙදර ආවා. අම්මා සමග සාකච්ඡා කලා. එදා හවසත් මල්ලි බලන්න ගියා කියලා. අම්මා කීවා. ඒ අවස්ථාවේදී මාගේ මව මගේ සහෝදරයා සම්බන්ධයෙන් කීවා මල්ලිට පහර දීලා කියලා කීවා. පොලිසියෙන් 14 වනදා මාගේ සහෝදරයා මල්ලි සමග අම්මා සමග කතා කරලා තිබෙනවා. පයාගල පොලිසියේ කතා කල බව කීවා. පොලිසියේ නිල මැදිරියේදී කතා කල බව කීවා. මා ගරු විනිසුරු තුමාට ප්‍රකාශ කලේ ජූනි 14 වනදා සිදුවූ සිද්ධියක් ගැනයි. ඊට පසුවදා 15 වනදා මාගේ සහෝදරයා සම්බන්ධයෙන් මා විසින් යම් පියවරක් ගත්තා. මා රැකියාවට ගියේ නැහැ. එදා නිවාඩු දවසක්. මාගේ සහෝදරයාගේ සම්බන්ධයෙන් එදා උදේ නීතිඥ මහතෙක් හමුවුනා. ඔහුට මල්ලි අත්අඩංගුවට ගත් විස්තරය කීවා. නීතිඥ මහතා හමුවීමට අමතරව මා බැංකුවට ගියා. මගේ සොහොයුරියගේ නිවසට ගියා. ඇයට යුධ හමුදා පොලීසියෙන් උපදෙස් දීලා තිබුණා මල්ලි අත්අඩංගුවට ගත් බවට යුධ හමුදා පොලීසියට දැනුම් දීලා නැත. එම නිසා ප්‍රදේශ බාර පො.අධිකාරීවරයා හෝ මානව හිමිකම් කොමිෂමට ඔවුන් විසින් පැමිණිලි කරන්න කියලා. ඉන්පසුව සොහොයුරියත් සමඟ පයාගල පොලීසිය බාර සහකාර පො.අධිකාරීව හමුවුනා. සහකාර පො.අධිකාරි මහතා මුණ ගැහුනේ නාගොඩ පොලිස් අධිකාරි කාර්යාලයේදී. ඒ මහතා සිටියා. මේ සම්බන්ධයෙන් කරුණු ප්‍රකාශ කලා. ඒ.එස්.පී. මහතා මා ඉදිරියේදීම ඒ මහතා යම් පියවරක් ගත්තා. පයාගල පොලිසියේ දුරකථනයෙන් අමතා ආමි කෙනෙක් ඉන්නවාද කියලා ඇහුවා. ඊට පස්සේ ඔව් කීවා. ඕගොල්ලා යුධ හමුදාවට භාර දෙන්න ඉක්මනින් කටඋත්තර අරගෙන. මා ඉදිරියේදීම මා සිටින විටම පයාගල පොලීසියට යම් උපදෙස් දුන්නා. ඊට අමතරව ඒ.එස්.පී. මහතා අපිට කීවා ගිහිල්ලා ඉන් ඉස්සර වෙලා මල්ලි බලන්න කියලා. ඒ.එස්.පී. මහතාගේ කාර්යාලයට ගියේ අක්කා සමගයි. ඒ කාර්යාලයේ සිට මා ගියා ප්‍රාදේශීය සභාපති බේරුවල ප්‍රා.සභාපති තුමාගේ

Scanned with CamScanner

02 APR 2019
COURT

ගෙදරට ගියා. එහේ ගියේ ඒ වනවිට ගමේ ආරංචි වෙලා තිබුනා ඔහු විසින් යම් බලපෑමක් කරලා පොලිසියෙන් මල්ලිට පහර දෙනවා කියලා. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න තමයි ගියේ. සභාපති තුමා සිටියේ නැහැ. සභාපති නොසිටි නිසා මම කොහේවත් තව ගියේ නැහැ. ඊට පසු පොලීසියට ගියා. පයාගල පොලීසියට ගියා. මා අක්කා සමග තමයි පොලීසියට ගියේ. දවල් 12.00 ත් 2.00 ත් අතර වෙලාවේ තමයි. ඒ.එස්.පී.මහතා මුණ ගැසුනා පසුවයි පොලීසියට ගියේ. එහේ ගිහිල්ලා හිටපු නිලධාරියෙකුගෙන් මල්ලි ගැන විමසුවා. මල්ලි ගැන තොරතුරක් ලැබුනා. පොඩ්ඩක් ඉන්න කියලා ආපසු ඇවිල්ලා කීවා පරීක්ෂණ කටයුත්තකට එළියට අරන් ගිහිල්ලා කියලා. කෑම ගෙනාවනම් දීලා යන්න කියලා කීවා. අපි ඒ.එස්.පී. මහතා හමුවෙන්න ගිහිල්ලා ආවේ කෑම ගෙනාවේ නැහැ කඩෙන් කෑම එකක් ගේන්නම් කියලා එළියට ආවා. අපි කෑම එකක් ගත්තා. ඒ කෑම එක අරගෙන ආපසු පොලීසියට ඇවිල්ලා ඒ නිලධාරිට දීලා කිරි පැකට්ටුවක් අපි මුලින්ම හමුවූ පොලිස් නිලධාරිට දුන්නා. මා රැගෙන ආ ආහාරපාන පොලිස් නිලධාරි බාර දීලා පොලිසියෙන් පිටවී ආවා. අපි මාරු වෙනවා සමහම පයාගල පොලීසියේ ජිප් රථයක් ඇතුල් වෙනවා දැක්කා. පොලිස් ජීප් රථය ඇතුල් වෙන විට මා සිටියේ ගාලුපාරේමයි සිටියේ. ඒ මා සිටිය තැනට පොලීසිය පේනවා. ඒ ජීප් රථය පොලීසියට ඇතුල් වෙනවිට අපි නැවත මාරු වෙන තැන ඇවිල්ලා මල්ලි පොලිස් ජිප් එකේ ඉන්නවා කියලා බැලුවා. ඒ ජීප් රථයේ ඉස්සරහ දොර ඇරගෙන අයි.පී.වික්‍රමරත්න පොලිස් නිලධාරියා පොලීසියට ගියා. ඒ නිලධාරි මහතා මේ සිද්ධියට කලින් දැකලා තිබෙනවා. ඒ අවස්ථාවේ වන විට මා හඳුනා ගෙන සිටියා යම් නිලයක් දරණ අයෙක් බව දැන සිටියා පො.ප වශයෙන් දැන ගෙන සිටියා. පයාගල පොලීසියේ සේවය කරන බව දැන සිටියා. වික්‍රමරත්න මහතා යම් නිලයක් දරන බව දැන ගෙන සිටියා. ස්ථානාධිපති ලෙස නිලයක් දරන බව දැන ගෙන සිටියා. මම මෙම සිද්ධියට කලින් වික්‍රමරත්න මහතා කලින් දැකලා තිබෙනවා. මා පදිංචි නිවස පදිංචි අදාළ පොලීසිය වන්නේ පයාගල පොලීසියයි. වික්‍රමරත්න මහතා එම පොලීසියේ පො.ප ලෙස සේවය කරනවා. ඒ මහතා පොලිස් ජීප් රථයෙන් බැස්සා දැක්කා. ඒ නිලධාරි මහතා අද අධිකරණයේ වි/කූඩුවේ ඉන්නවා. වි/කරු සාක්ෂිකාරිය විසින් හඳුනා ගනී. මේ වි/කරු තමයි එම ජීප් රථයෙන් බැස්සේ. තව ඉදිරිපසින් දොර ඇරලා චන්ද්‍රසිරි කියන පොලිස් නිලධාරියා බැස්සා. චන්ද්‍රසිරි පො.නි. මෙම දවසේ ජීප් රථයෙන් බහිනවා දකිනවා හැර වෙනත් ස්ථානවලින් දැකලා තිබෙනවා. පොලිස් ස්ථානයට ආවාට පස්සේ දැකලා තිබෙනවා. රාජකාරි කරන වෙලාවේත් දැකලා තිබෙනවා. එම පොලි.නි. පයාගල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන බව දැන ගෙන සිටියා. තව මල්ලි සිටියා දැක්කා. මගේ සහෝදරයා ජීප් රථයෙන් බහින්න උත්සාහ කලා. බහින්න බැරි වුනා. මට ඒ බව පැහැදිලිව පෙණුනා. මල්ලිට පහර දීම නිසා මල්ලි වැටෙන තත්වයෙන් සිටින බව දැනගන්නට ලැබුනා. මගේ සහෝදරයා චන්ද්‍රසිරි කියන පො.නි. මල්ලිව අල්ලා එළියට ගත්තා. ඒ අවස්ථාවේදී මා මල්ලිව දැක්කා. අපි දෙන්නා මල්ලිව අපිත් මල්ලිව දැක්කා. ජීප් රථයෙන් බස්සවා සහෝදරයා අතින් අල්ලා ගෙන පොලීසියේ ඇතුලට අරන් ගියා. අරගෙන යන අවස්ථාවේදී චන්ද්‍රසිරි කියන පො.නි. ඔහුව අල්ලාගෙන මල්ලිව ගියා. ඇවිදින මල්ලි

Scanned with CamScanner

02 APR 2019 HIGH COURT

කොර ගස ගසා තමයි ගියේ. මල්ලිව අත්අඩංගුවට ගන්නා පෙර මල්ලිට කිසිම අපහසුතාවයක් තිබුනේ නැහැ. කොර ගැසුවේ නැහැ. චන්ද්‍රසිරි කියන නිලධාරියා වත්තම කරගෙන ජීප් රථයෙන් බැහැලා පොලීසිය ඇතුලට යනවාත් සමහම අක්කා මා සමග පොලීසියට ඊට පස්සට ගියා. මාගේ සහෝදරයා ඉස්සරහින් ගියා. එයා පස්සෙන් අමා සහ අක්කා ගියා. පොලීසියට අරන් ගිහිල්ලා පොලිස් කූඩුව ඇතුලට මල්ලි තල්ලු කලා. චන්ද්‍රසිරි කියන පො.නි. යා තමයි එහෙම කලේ. පො. සිර මැදිරියට මල්ලිව දාලා ඔහුව දොර වැසුවා. අපි ආවා පුටුවක වාඩිවෙලා සිටියා. අයි.පී. වික්‍රමරත්න මහතා. මේ වි/කූඩුවේ ඉන්නා වි/කරුයි. මා ඒ අවස්ථාවේදී වි/කරු සමග කතා කලා. අපි කීවා අපට අවශ්‍යයි මල්ලිව බලන්න කියලා. ඒ පොලීසියේ කොරිඩෝවට ආවා. පොලීසියේ ඇතුලේ තිබෙන නිසා ඇයි කියලා ඇහුවා. පොලිස් කූඩුව තිබෙන්නෙත් ඇතුලේමයි පො.ප ඒ මහතා වාඩිවෙලා සිටියේත් ඒ තැනමයි. ඒ පැත්තට ආවා. ඒ අවස්ථාවේදී වි/කරු සමග කීවා අපි අක්කලා කීවා මල්ලිව තියාගෙන ගහන්නේ මල්ලිට කරපු වරද්ද මොකක්ද කියලා ඇහුවා. ආමි එකට දැනුම් දීලා නැහැ නේද. අපි ඒ.එස්.පී මහතා හමුවෙන්න ගියා. අපි එයා තමයි මෙහාට එව්වේ. එයට අමතරව අපි හොරු නොවෙයි අපි සමාජයේ වැදගත් විදියට ජීවත් වෙන මිනිස්සු ඇයි අපිට මේ විදියට සලකන්නේ කියලා ඇයි ඔගොල්ලෝ මල්ලිට ගැහුවේ. එයා පොඩි කාලයේ ශෛල්‍ය කර්මයකට භාජනය කරලා තිබෙන්නේ මාස 2 කට කලින් පැපොල් රෝගය හැදුනා එයාට. මල්ලිට තවත් අයගේ බලපෑම් මත පහර දෙන්න එපා කියලා කීවා ඉල්ලීමක් කලා. මා මේ කරුණ වි/කරුට ප්‍රකාශ කලා. මේ කරුණු සම්බන්ධයෙන් වි/කරු මා හට එයා කීවා දැන් වෙලාවක් නැහැ. සවසට එන්න ඒ එනවිට ගෙදර තිබෙනවා නම් තැලුම් තෙල් ටිකක් අරන් එන්න කියලා කීවා. ඒ අවස්ථාවේදී මා මල්ලි සමග කතා කලා. වි/කරු අපිට කීවා මල්ලිව බලන්න කියලා. මල්ලි මා සමග කතා කලා. මේ මගේ මල්ලි සමග පොලිස් අත්අඩංගුවට පත් වෙලා මා කතා කල මුල් අවස්ථාවයි මේ. මල්ලිගෙන් මා ඇහුවා පොලීසියෙන් ඇහුවා ගැහුවාද කියලා. වි/කරු මේ කූඩුව අසල සිටියා. මගේ සහෝදරයා මාර්ගයෙන් යම් කරුණු දැන ගන්නට ලැබුණා. පොලීසියෙන් පහර දුන් බවට මල්ලිගෙන් දැන ගන්නට ලැබුණා. වැඩිදුර තොරතුරු ලබා ගන්න හැදුවේ නැහැ. මල්ලිට ගැහුවා කියලා ඇහුවා ඔලුව වැනුවා විතරයි. වි/කරු එතන සිටිය නිසා කියන්න බිය වූ බව අපි දැනගත්තා. අපි ඒ නිසා මල්ලිගෙන් වැඩි විස්තර ඇසුවේ නැහැ. එතන ඉඳලා අපි ගෙදර ආවා. ගෙදරට ආවේ නැහැ පාරේ කොළඹ සිට ගාල්ල දෙස සිට වාහනයක් ආවා. අපි දැකලා හරවා ගෙන යනවා අපි දැක්කා. ඒ වාහනය ඇවිල්ලා නතර කලා. ඒ වාහනයේ පුංචි අම්මා විදේශ ගතවී සිටියා එයා තමයි එම වාහනයේ සිටියේ. අපි පුංචි අම්මාට මොකුත් කිව්වේ නැහැ අඳුරන්නේ නැති අය සිටි නිසා. අපි කීවා පොලීසියට ආව කියලා. අක්කා මොරටුවට යන නිසා. පුංචි අම්මා සමග ගෙදරට ගියා. එදා දවසේ දෙපාරක් පොලීසියට ආවා. පලවන වතාවේ ආවේ පුංචි අම්මා සමග. ඒ අවස්ථාවේදී ගෙදරින් ඇවිල්ලා කඩෙන් පැනඩෝල් සහ සිද්ධාලේප අරගෙන පොලීසියට ගියා. ඒ ගියේ පුංචි අම්මා සමගයි. පොලීසියට ගිහිල්ලා අපි වික්‍රමරත්න මහතා ඉන්නවා කියලා සිටපු නිලධාරියා ගෙන් ඇහුවා. ඒ නිලධාරියා කීවා

Scanned with CamScanner

කොහේටද ගියා කියලා. මල්ලි සමග කතා කලා. එදා දවසේ දෙවන වතාවටයි මල්ලි සමග කතා කලේ. මල්ලි එදා දවසේ දෙවන වතාවට සිර මැදිරියේ සිටියේ. සිමෙන්ති බැම්මක් වගේ තිබුනා නිදා ගන්න වගේ එකක්. ඒකේ මල්ලි ඇල වෙලා සිටියේ ඊට පසුව මල්ලිව අපි දැකලා අමාරුවෙන් නැගිටලා ඒක උඩ වාඩි වුනා. ඒ අවස්ථාවේදී මල්ලි සමග කතා කලා. තොරතුරුවලට අමතරව වෙන තොරතුරු කියන්න මල්ලි ඉන්න අයුරින් මම දැන ගත්තා මල්ලිට ඉන්න බැරි තත්වයෙන් සිටින බව දැනගන්නට ලැබුණා. මල්ලිට අසනීප බව දැන ගත්තේ මල්ලිව නැගිටලා සිටියේ අමාරුවෙන් අපි ගෙනපු දේවල් මල්ලිව ප්‍රතික්ෂේප කලා. මල්ලිට කිරි එකක් හදාගෙන ගියා මල්ලි කීවා මට එපා මට බීවාම වමනයට යනවා කියලා. කීවා. මල්ලි වමනය දාන්නේ නැහැ ගෙදරදී මල්ලිට කෑම හදාගෙන ගියේ නැහැ. කිරි තමයි ගෙනගියේ. මල්ලිට දවල් ගෙනගිය කෑම තිබිලා ඒක කෑම එක ගෙදර ගෙනියන්න කියලා කීවා. මා ඇහුවේ මොකද කියලා. ඒ අවස්ථාවේදී පො.නි. එතන සිටියා. මල්ලිව අසනීප තත්වයෙන් පසුවෙන බව අපිට පෙනුනා. පුංචි අම්මා සමග එතනින් ආවා. ඇවිල්ලා පො.නි. කීවා සවසට ඇවිල්ලා වික්‍රමරත්න මහතා හමුවෙන්න කියලා. මේ අවස්ථාවේදි අයි.පී.ධර්මසේකර මහතා ඇවිල්ලා අර පො.නි. ඇහුවා මේ කට්ටිය කවුද කියලා. අපි තවත් නිලධාරියෙක් දැක්කා. එයා ධර්මසේකර පො.නි. මහතායි. එයාත් පයාගල පො. ස්ථානයේ සිටින බව දන්නවා. දෙවන වතාවට 15 වනදාත් පුංචි අම්මා සමග පොලීසියට ගියා. ඒ කිරිවලට අමතරව පැනඩෝල් සහ සිද්ධාලේප ගෙන ගියා. සිද්ධාලේප මල්ලිට දුන්නා. මල්ලිව ඒවා ඇගේ ආලේප කරන්න දුන්නේ නැහැ. අයි.පී.සමග විනාඩි 5 ක් වගේ වෙලාවක් කතා කලා. සවසට ඇවිල්ලා වික්‍රමරත්න මහතා හමුවෙන්න කියලා කීවා. ධර්මසේකර මහතා ඇවිල්ලා ඇහුවා යන්න දුන්න පො.නි. ඇහුවා මේ කට්ටිය කවුද කියලා. ඒ පො.නි. කීවා අර කේස් එකේ අය කියලා. ඒ නිලධාරියා කීවා අපි ඒකට සම්බන්ධ නැහැ කියලා කීවා. අපි පසුව ගෙදර ගියා. අපි නැවත සවස 7.00 ට පමණ පොලීසියට ආවා. පො. ස්ථානයක් මාගේ නිවස අතර බස් එකේ යනවානම් රු. 3.00 ක පමණ දුරයි. බස් එකේ යනවා නම් විනාඩි 30 ක් අතර කාලයක් යනවා අපේ ගෙදර ඉඳලා පොලීසියට යන්න. නැවතත් පුංචි අම්මා සහ මමත්, බාල සහෝදරයාත් සමග පොලීසියට ගියා. නැවතත් අම්මා රෑට ගේන්න කෑම හදලා තිබුනා. ඒ කෑමත් කිරි එකක් හදලා ගෙනාවා ඒවත් රැගෙන ආපසු ආවා පොලීසියට. ඒ ඇවිල්ලා ඒ එනවිට වි/කරු පොලීසියේ සිටියා. ඒ අවස්ථාවේදී වි/කරු මුණ ගැසුනා. වි/කරු සමග කතා කිරීමට පෙර මල්ලි සමග අපි කතා කලා. ඒ වෙලාව සවස 7.00 ට පමණයි. මල්ලිව ඒ වෙලාවේ මුලින් විදියටම නිදා ගෙන සිටියේ. මල්ලි සමඟ තවත් සිරකරුවෙක් සිටියා. ඒ අවස්ථාවේදී සිටපු සිරකරු මා දන්නේ නැහැ. නම දන්නෙත් නැහැ. සිර කූඩුවේ සිටි මල්ලි සමග කතා කලා. කිරි හදාගෙන ගියා. මල්ලිට පොවන්න කියලා අනිත් සිරකරුට දුන්නා. ඔහු අරගෙන මල්ලිව වාඩි කරලා අරෙන් ටිකක් පෙව්වා. පොවලා පොවන විට මල්ලිව කීවා මට එපා කියලා. ඊට පසුව පෙව්වේ නැහැ. කූඩුව කිට්ටුවට අපි සමග කතා කරන්න කූඩුව කිට්ටුවට ලං කලා. අපි ගෙන ගිය කිරි බෝතලය වෙනත් අයෙක් තමයි මල්ලිට බොන්න ඇල්ලුවේ. සිර මැදිරියේ ඉදිරියට ඇවිල්ලා අත දික්කරලා ගන්න මල්ලිට

Scanned with CamScanner

බැරිවුනා. මල්ලිව සිර කූඩුවෙ සිටියෙ අයෙක් තමයි මල්ලිව වත්තක් කරගෙන ආවේ. මල්ලිව සමග අපි කතා කලා. මට උණ ගන්නවා. මගේ පපුව රිදෙනවා කියලා කීවා. ඊට පසුව පුංචි අම්මාත් මල්ලි බාල සොහොයුරා සමග කතා කර කර ඉන්න කියලා මා ගිහිල්ලා වි/කරු සමග කතා කලා. මා කීවා වි/කරුට කීවා මල්ලිට උණ ගන්නවා පපුව රිදෙනවා කියන නිසා අරන් යන්න කියලා. කීවා. වි/කරු කීවා මෙ අවස්ථාවේදී ඒවා කරන්න බැහැ. ළග තිබෙනවා ඩිස්පෙන්සරියක් එතනට ගිහිල්ලා මම කීවා කියලා බෙහෙත් ඉල්ලන් එන්න කියලා වි/කරු කිවා. පොලිස් ස්ථානයෙන් වෙනත් තැනකට ගියේ නැහැ. මල්ලිට පහර දෙන නිසා මල්ලිට අසනිප වෙන බව තියනවා කියලා කීවා. වි/කරු කීවා එහෙම කියන්න එපා සාමාන්‍ය ලෙඩක් කියලා බෙහෙත් ඉල්ලා ගෙන එන්න කියලා කීවා. වි/කරු කීවා වෛද්‍යවරයාට මම කීවා කියලා කියන්න කීවා. ඒ අවස්ථාවේදී එතනට පුංචි අම්මා ආවා. වි/කරු කීවා "මූ කතා කලේ නැහැ ඒක නිසා ගහන්න වුනා කියලා කීවා" එම ප්‍රකාශය වි/කරු කීවේ පුංචි අම්මා සහ මා ඉදිරියේදී තමයි ප්‍රකාශය වි/කරු කලේ. ඊටපස්සේ අපි තුන් දෙනාම චම්පික මල්ලිත් සමග ඒ ළග තිබුන ඩිස්පැන්සරියට ගියා. පොලීසියේ ඉඳලා පෙනෙන දුර ප්‍රමාණය තමයි ඩිස්පෙන්සරිය තිබෙන්නේ. වෛද්‍ය යුවලක් සිටියා. අපි ගිහිල්ලා දෙදෙනාම සිටියා දෙදෙනාම මූණ ගැසුනා. අපි ආනන්ද කියන වෛද්‍යවරයාට කීවා මල්ලිට පොලීසියෙන් පහර දීලා දැන් මල්ලි අසනීප තත්වයෙන් ඉන්නේ එයා පපුව රිදෙනවා කියනවා උණ තිබෙනවා ඒ බව පොලීසියට කීවාම පොලීසියෙන් කීවා බෙහෙත් අරගන්න කියලා..නමුත් ඔහු කීවේ සාමාන්‍ය ලෙඩක් කියලා බෙහෙත් ගන්න කියලා කීවා. ඒ අවස්ථාවේදි ඒ වෛද්‍යවරයා බෙහෙත් දුන්නේ නැහැ. වෛද්‍යවරයාගෙන් බෙහෙත් ලබා ගන්නා මා ඉල්ලීමක් කලා. මට කිසිම බෙහෙතක් ලැබුනේ නැහැ. මේ රෝගීව ඉන්නා මල්ලිව ඒ ඩිස්පෙන්සරියට රැගෙන ආවේ නැති නිසා ඖෂධයක් ලබා ගන්න බැරි වුනා. ඒ ඩිස්පෙන්සරියේ ඉඳලා ආපසු පොලීසියට ඇවිල්ලා වි/කරු හමුවුනා. වෛද්‍යවරයාට කීව දේ වි/කරුට කීවා. ඒ සම්බන්ධයෙන් වි/කරුව කීවා මල්ලිව ක/මහරෝහලට අරන් යන්න කියලා. අපි ආපහු එනවිට වි/කරු එතන සිටියේ නැහැ වෙනත් පො.නි. සිටියේ නැහැ. මල්ලිව ක/රෝහලට ගෙන යන්න ආපහු මල්ලිට ගිහිල්ලා කීවා ඔයා වික්‍රමරත්න මහතා ආවම වැඩි ප්‍රතිකාර ඉල්ලන්න කියලා. කියවා දීමෙන් පසු හරි බවට පිළිගෙන මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

අත්.කලේ - සාක්ෂිකාරිය

අත්.කලේ

මහෙස්ත්‍රාත් - කළුතර.

පැ.සා. 1 සාක්ෂි අවසන් නැත.

පැ.සා. 1 සි 5 දක්වා අවවාද.

වැ.විමසීම 2003.08.22 ප.ව 1.30

අත්.කලේ

මහෙස්ත්‍රාත් - කළුතර.

Scanned with CamScanner

02 APR 2019
COURT

මහෙස්ත්‍රාත් කළුතර ටී.ජී.සී.ඒ. පෙරේරා මැතිතුමා ඉදිරිපිට දීය.

නඩු අංකය : 46635/එන්.එස්.

2003.08.22 දින.

පෙනී සිටීම පෙර පරිදිය.

1 විත්තිකරු සිටී.

රජයේ නීතිඥ මහතා පැමිණිල්ලට පෙනී සිටී.

පැ.සා. 1 ගෙන් වැඩිදුර මූලික සාක්ෂි :

මේ අවස්ථාවේ දී වැඩිදුර මූලික සාක්ෂි පටන් ගැනීමට පෙර රජයේ නීතිඥ මහතා පසුගිය දින සාක්ෂි සටහන් වල වැරදි කිහිපයක් ගැන අධිකරණයේ අවධානය යොමු කරයි.

ගරු මැතිතුමණි ගිය දිනයේ එනම් 2003 ජූනි 26 වන දින පැමිණිල්ල විසින් සාක්ෂි දීම සඳහා කැදෙව්වේ. මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති යන සාක්ෂියක්. එම සාක්ෂිකාරියගේ මූලික සාක්ෂි අවසන් නැහැ ස්වාමිණි.

ඇයගේ සාක්ෂිවල සහතික කරන ලද කාර්යය සටහන් කියවා බැලීමේ දී එම කාර්යය සටහන් වල යම් යම් යතුරු ලියන දෝෂ කිහිපයක් තිබුන බව පෙනී යනවා මැතිතුමණි. එම යතු/ලිය දෝෂ විවර කිරීම සඳහා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මැතිතුමණි මෙම ය.ක ලද සාක්ෂි පිටපත් වල 1 වන පිටුවේ අවසාන වාක්‍යය මා විවාහකයි, එය මා අවිවාහකය යනුවෙන් නිවැරදි විය යුතුය.

තවද, 2 වන පිටුවේ ප්‍රශ්නයක් අසා තිබෙනවා. ප්‍ර : මියයන විට සොහොයුරා කොච්චර කාලයක් වෙනවා. මා විවාහ වුනේ 1997 ජූනි 23 වෙනි දින. එය මෙසේ නිවැරදි විය යුතුය. මිය යන විට සොහොයුරා කොච්චර කාලයක් වෙනවද විවාහ වෙලා.

ඔහු විවාහ වුනේ 1997 ජූනි 23 වෙනි දින.

3 වන පිටුවේ ය/ලි වී ඇත්තේ මෙසේය. 'පසුදා උදේ මා පොලීසියට ගියේ නැහැ 'අම්මා අඩ ගැහුවා පොලීසියට ගිහිල්ලා මල්ලි බලන්න ගියා.' එය අම්මාට කියුවා පොලීසියට ගිහිල්ලා මල්ලි බලන්න ගියා යනුවෙන් නිවැරදි විය යුතුය.

පස්වන පිටුවේ 'උත්තරයක් දී තිබෙනවා නීතිඥ මහතා හමුවීමට අමතරව මා බැංකුවට ගියා.' 'නීතිඥ මහතා හමුවීමට අමතරව මා මොරටුවට ගියා යනුවෙන් නිවැරදි විය යුතුය.

Scanned with CamScanner

02 APR 2019

මෙම අවස්ථාවේ දී වි/නීතිඥ මහතා මෙසේ කියා සිටී.

මා පවසා සිටින්නේ, අදාළ දිනයේ දී සාක්ෂිකාරිය ගරු අධිකරණයේ දී තිබෙන සාක්ෂිය සටහන් කර ගැනීමෙන් පසුව එහි ය/ලියනය කිරීමේ දී යම් අකුරු වල වෙනසක් සිදු වී ඇත්නම් ඒ අකුරු පමණක්, වෙනස් කිරීමට මා විරුද්ධ නොවන බවත්, ඇය විසින් පවසා තිබෙන ප්‍රකාශයක් වෙනත් අදහසක් එළඹෙන ආකාරයට වෙනස් කිරීමට කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන් මා මාගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටින බවයි.

ඒ අනුව ඇය විසින් ගිය දිනයේ සාක්ෂි දීමේ දී ඇය පවසා සිටින යම් සාක්ෂි කණ්ඩයක් ඊට විරුද්ධව අදහසක් ඇති වෙන ආකාරයෙන් හෝ එම අදහසට වෙනත් අදහසක් ඒත්තු යන ආකාරයට වෙනස් කිරීමට ඉල්ලා සිටීම සම්බන්ධයෙන් මා විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා.

ගිය දිනයේ යම් කරුණක් ගැන නැවත අසා දැන ගැනීමට අවශ්‍ය නම් මේ අවස්ථාවේ දී මූලික සාක්ෂි අවසන් නොකර ඇති බැවින්, කිසිදු බාධාවක් ඇති නොවන බව ද මා ඉතාමත්ම ගෞරවයෙන් පවසා සිටිනවා.

රජයේ නීතිඥ මහතා මෙසේ කියා සිටී.

මා ඉහතින් දැක්වූ නිවැරදි කිරීම් වලට අමතරව තවත් සුළු සුළු යත/ලිය කිහිපයක් ඇති බවත්, ගරු අධිකරණයට ප්‍රකාශ කර සිටිනවා.

<u>නියෝගය.</u>

මෙම ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමේ දී ය/ලියනය දෝෂ ඇතැයි කියනු ලබන අදාළ කොටස් මෙම නඩුවේ හරයටම බලපාන බරපතල ගනයේ ඒවා නොවන බැවින් ද මෙම නඩුවේ මූලික සාක්ෂිය පැමිණිල්ල විසින් මෙතෙක් අවසන් කර නොමැති බැවින්ද, අදාළ කරුණු පැමිණිල්ලට පැහැදිලි කිරීමට තවත් අවස්ථාව තිබෙන බැවින් ද, මෙම නඩුවේ වැඩිදුර මූලික සාක්ෂිය මෙහෙයවන ලෙසට නියම කර සිටිමි.

අත්.කලේ

මහෙස්ත්‍රාත් - කළුතර.

වැඩිදුර මූලික සාක්ෂි :-

සම්පූර්ණ නම : මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති නැ/කැඳවා සහතික කරන ලදී.

Scanned with CamScanner

මේ නඩුවේ කලින් අවස්ථාවකදී එනම් ජූනි 26 වන දින සාක්ෂි දුන්නා මතකයි. ඒ අවස්ථාවේ දී මා කියා සිටියා මගේ සහෝදරයාගේ අසනීප තත්වය හේතුකොට ගෙන බෙහෙත් ලබා ගැනීමට පයාගල පොලිස් ස්ථානය අසල තිබුන ඩිස්පෙන්සරියට ගිය බව. ඒ අවස්ථාවේ දී වෛද්‍යවරයා යම් ප්‍රතිකාරයක් කිරීම ප්‍රතික්ෂේප කෙරුවා. ඒ දොස්තර මහත්මයා බෙහෙත් ලබා දෙන්න බැහැයි කියුවා කියන කාරණාව මා මගේ සහෝදරයාට කිව්වා. ඒ බව මා පොලිස් නිලධාරියකුට කියුවා. ඒ අවස්ථාවේ දී මගේ සහෝදරයන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සම්බන්ධයෙන් මා උපදේසයක් ලබා දුන්නා. මගේ සහෝදරයාට මා කියුවා වික්‍රමරත්න මහත්තයාට කියන්න කියුව ආවාම නාගොඩ රෝහලට අරගෙන යන්න කියලා. මට සනීප නැහැ කියලා මේ ආකාරයට ඩිස්පැන්සරියට ගියේ 15 වෙනිදා. 16 වෙනිදා එනම් පහුවෙනිදා මම නැවතත් පොලිසියට ආවා. මා ආවේ අක්කයි, මමයි, පුංචි අම්මායි. 16 වෙනිදා පයාගල පොලීසියට ආවේ 10.00 12.00 ත් අතර වෙලාවට. ඒ අවස්ථාවේ දී මේ නඩුවේ ඉන්න විත්තිකරුත් මා පොලිස් ස්ථානයේ දී මුණ ගැසුනා. ඒ අවස්ථාවේ දී මා කියුවා මල්ලි අසනීපයෙන් ඉන්නවා අපි ඩිස්පැන්සරියට ගියා දොස්තර මහතා කියුවා රෝහලට අරන් යන්න කියලා. ඇය මල්ලිව රෝහලට ඉදිරිපත් කරන්නේ නැත්තේ කියලා වික්‍රමරත්න මහතාගෙන් ඇසුවා. මා කියපු කරුණ වලට විත්තිකරු කියුවා මෙයාට එච්චර ලෙඩක් නැහැ. අධිකරණයට ඉදිරිපත් කලාට පස්සේ අවශ්‍ය නම් බෙහෙත් ලබා දෙනවා. අද පොසොන් පොහොය දවස ඒක නිසා අද අධිකරණයට ගෙනියන්නේ නැහැ, එහෙ ගෙනිච්චත්, හිරකරලා තියෙන්නේ, අද දවසත් මෙහෙ ඉදපුදෙන් කියලා වික්‍රමරත්න මහතා කියුවා. මා කලින් කියුවා 16 වෙනිදා පයාගල පොලීසියට ගියේ උදේ 10.00 වත් 12.00 ත් අතර බව. ඒ යන විට මාගේ සහෝදරයා කෑම කාලා සිටියේ නැහැ. ගෙදරින් පිටත් වෙන කොට සහෝදරයාට කෑම අරන් ගියා. ඒ කෑම මගේ සහෝදරයාට දෙන්න උත්සාහ කලා. ඒ වුනාට ඒ කෑම කෑවේ නැහැ. ඒ අවස්ථාවේ දී ආහාර අනුභව නොකරන්න විශේෂ හේතුවක් වුනේ කෑම කෑවාම වමනය එනවා කියලා කියුවා. කෑම වලට අමතරව බීමත් අරන් ගියා. කිරි බිව්වේ නැහැ. කිරි අරන් ගියාට. පෙවීමට අක්කා උත්සාහ කලා. මල්ලී බිව්වේ උගුරයි. ආපසු ප්‍රතික්ෂේප කලා. ඊට පසුව පයාගල පොලීසියේ සිට මා අක්කා එක්ක පාම්සියකට ගියා. පාම්සියට ගිහින් තැල්මට ගාන අලේපනයක් ගත්තා. ඒ බෙහෙත් ගත්තේ මල්ලිගේ තැලුම් තුවාල වලට ගාන්න. පොලීසියේ සිට පාම්සියට දුර පාම්සි එකත් ඩිස්පෙන්සරිය වගේ පොලීසියට පේන දුර වගේ තිබුනේ. ඒ ආලේප වර්ග අරගෙන මල්ලි ඉන්න තැනට ආවා. පයාගල පොලීසියට ආවා. ඒ දෙවෙනි වර ආපු අවස්ථාවේ මේ විත්තිකරු සිටියා. අරගත්ත බෙහෙත් මා දුන්නා මේක මල්ලිගේ ගාන්න කියලා විත්තිකරුට දුන්නා. විත්තිකරු බෙහෙත් බාර ගත්තේ නැහැ. ඔයගොල්ලො ගාන්න කියුවා. ඒ ක්‍රීම් වර්ග සහෝදරයගේ ඇගේ ගාන්න විත්ති කූඩුව ඇරලා දුන්නා. පොලීසියේ නිලධාරි මහතෙක්. පසුව මම ඇතුලට ගියා. ජගත් කුමාරගේ බෙහෙත් ගාන්න උත්සාහ කලා. බෙහෙත් ගාන්න හැදුවා. මල්ලි අත් කොට කමිසයක් ඇඳගෙන සිටියේ. ඒ කමිසය ගලවා දකුණු අතේ නම් ගාන්න හැදුවාම එපා කියුවා. මම ඒ අත දැක්කා දකුණු අත විශාල වශයෙන් ඉදි මී තිබුනා. ඒ වගේම දම්

Scanned with CamScanner

0 2 APR 2019

පාටට හුරු කළු පාට වෙලා තිබුනා. මම දැක්කා. අතට අමතරව ශරීරයේ තවත් විශේෂ දේවල් බැලුවා. මල්ලිගේ පපුවට ගාන්න හදන කොට අක්කාට කියුවා ඒ හරිය රිදෙනවා කියලා ගාන්න දුන්නේ නැහැ. මම මල්ලිගේ පපුව ප්‍රදේශය බැලුවා. මල්ලි අල්ලන්න දුන්නේ නැහැ. මේ මරණකරුගේ දෙපා කකුල් දිහා බැලුවා කකුල් සහ විලුඹ සම්පූර්ණයෙන්ම ඉදිමිලා තිබුනා. මේ තුවාල දැක්කාම මම කියුවා මෙහෙමත් මිනිස්සුන්ට ගහනවාද තිරිසනුන්ට ගහනවාද මෙහෙම ගහන්න අපි මොකක්ද කරලා තියෙන වරද කියලා ඇසුවා. මා එම ප්‍රකාශය කරන කොට එතන පවුලේ උදවියට අමතරව තවත් අය වශයෙන් සිටියේ විත්තිකරුයි. එම ප්‍රකාශය මම කෙරුවාම විත්තිකරු ප්‍රතිචාරයක් වශයෙන් ඔහු එතනින් යන්න ගියා. ඊට පසුව මල්ලි ප්‍රතික්ෂේප කෙරුවත් ඒ ආලේප (අපැහැදිලි තැනක්) ගාලා ඊට පස්සේ පොලීසියෙන් ආපසු ආවා. ඊට පසුව සවස අක්කායි නංගියි ගියා. මා ගියේ නැහැ. අක්කා යනුවෙන් අදහස් කලේ දීපිකා ජයන්ති. අක්කා ගෙදරින් පිටත් වෙන කොටම මම සිටියා. අක්කා වෙනිවැල්ගැට තම්බාගෙන ගියා. ඊට පසු වෙනිදා එනම් 17 වෙනිදා මා ගියේ 15 වෙනිදා හමුවුන නීතිඥ මහතා හමුවන්න. ඊට අමතරව මා පොලීසියටත් ගියා ඒ ගියේ මම තනියමයි. පොලීසියට යන කොට ඊට පෙර අක්කා සහ පුංචි අම්මාත් ගිහින් සිටියා. පොලීසියේ ගේට්ටුව ගාවට ඒ අවස්ථාවේ දී මා අක්කා සමඟ කතා කලා. මා ඇසුවා මල්ලිව අධිකරණයට ගෙනියනවාද පොලීසියෙන් මොනවාද කියුවේ කියලා ඇසුවා. ඒ අවස්ථාවේ දී අදත් අධිකරණයට ගෙනියන පාටක් නැහැ අපිව ඉක්මනට යන්න කියලා පොලිස් නිලධාරියෙක් කියුවා කියලා. මම පොලීසියට ගියා. මල්ලිව හමුවන්න කලින් විත්තිකරුව හමුවුනා. ඔහු සිටියා. විත්තිකරු සමඟ මා කතා කලා. මම විත්තිකරුගෙන් ඇසුවා, අදත් මල්ලිව අධිකරණයට ගෙනියන්නේ නැද්ද, නැතිනම් මම මානවහිමිකම් කොමිෂමට යනවා, ඔයගොල්ලො ඊයෙත් ගෙනියනවා කියලා අපිව රැවෙට්ටුවා. විත්තිකරු කියුවා තව ටිකකින් මල්ලිව අධිකරණයට ගෙනියනවා කියලා කියුවා. විත්තිකරු කියුවා මල්ලිට කිරි එකක් ගෙනවිත් දෙන්න කියලා. ඒ අවස්ථාවේ දී පුංචි අම්මා සහ අක්කා ආවා. ඒ අයට මල්ලි බලන්න දුන්නේ නැහැ. ඒ අය දැන් පාරේ ඉන්නවා ඒ අයට කතා කරන්න ද කියා විත්තිකරුට කියුවා. විත්තිකරු කියුවා එයාලාට එක්කගෙන එන්න කියලා. ඊට පසුව මගේ සහෝදරයාව මම දැක්කා. විත්තිකරු එතන සිටියා. චන්ද්‍රසිරි කියන පොලිස් නිලධාරියාට විත්තිකරු කියුවා ලසන්තව එක්කගෙන එන්න කියලා විත්තිකරු කියුවා. චන්ද්‍රසිරි නිලධාරියා එක්කගෙන ආවා. එක්කගෙන ආවේ වත්තම් කරගෙන. වත්තම් කරගෙන එනවා මා දැක්කා. මල්ලිගේ කකුල් දෙක ඉදිමෙලා තිබුනා. ඇවිදින්න අපහසුවෙන් සිටියේ. පයාගල පොලීසියේ සිටින විට මගේ මල්ලිව පයාගල පොලීසියෙන් අධිකරණයට ඉ/පත් කරලා තිබුනේ නැහැ. කිසියම් හෝ වෛද්‍ය ප්‍රතිකාරයක් ලබා දී තිබුනේ නැහැ. මා දන්නා පරිදි. මල්ලිව වත්තම් කරගෙන මා ඉදිරියට ආ අවස්ථාවේ දී එතන තිබුන පුටුවේ මල්ලිව නිදිකලා. ඒ අවස්ථාවේ දී එතනට මල්ලි සහ මම හැර අක්කා සහ පුංචි අම්මා සිටියා විත්තිකරුත් සිටියා. චන්ද්‍රසිරි කියන පොලිස් නිලධාරියාත් සිටියා.

1

මල්ලිව ගෙනාවට පසුව නැවතත් විත්තිකරු සමග කතා කලා. මා ඒ අවස්ථාවේ දී විත්තිකරුට කියුවා වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්න කියලා. අධිකරණයට ඉදිරිපත් කලාම රිමාන්ඩ් කරනවා. වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය නම් එහිදි ලබා දෙනවා. 29 වෙනිදාට මෙයාට ඇප ගන්න පුළුවන්. එදාට ඔය ගොල්ල ඇවිල්ල ලබා ගන්න අපිත් උදව් කරන්නම් කියලා කියුවා. ඊට අමතරව දැන් ඔය ගොල්ලා ගෙදර යන්න, රිමාන්ඩ් එකට ගිහින් පස්සෙ බලන්න කියලා විත්තිකරු කියුවා. ඒ අවස්ථාවේදි චන්ද්‍රසිරි කියන පොලිස් නිලධාරියා මල්ලිට කියනවා ඇසුනා “ උඹට මෙවගේ අක්කලා හම්බ වෙන්නේ නැහැ මිනිස්සු ඇවිත් අපට කියුවා. උඹලාගේ අයියලා දෙන්නා රත්තුං මිනිස්සු කියලාත්.

මගේ සහෝදරයාට ක්‍රීම් ගාන්න උත්සාහ කලා. එවිට අක්කා කියුවා පොලිසියෙන් ඉඩ දුන්නේ නැහැ. අපි ඉක්මනින් පිටත් කලා. ඒ අවස්ථාවේදි විත්තිකරු කියුවා නැහැ ඔය ක්‍රීම් එක ගාන්න කියලා. ඒ අවස්ථාවේදි මල්ලි කියුවා දකුනු අත පෙන්නලා කියුවා ඒ අතේ ගාන්න එපා දැවිල්ලයි කියලා කියුවා. ඊට පසු එම ස්ථානයෙන් ඉවත් වෙලා ගිහින් පොලිසියේ අසල පාරේ සිටියා. එසේ සිටියේ මල්ලිව අධිකරණයට ගෙනියනවාද කියලා බලන්න. එදා දවසේ මල්ලිව පොලිසියට ගෙනයනවා කියන බලාපොරොත්තුව ඇතිවුනේ විත්තිකරු කියුවා මල්ලිව අධි/අරගෙන යනවා කියලා. අපි පැය 1 ½ක් විතර පොලිසිය අසල බලා ගෙන සිටියා.ඒ කාල සීමාව තුලදී මල්ලිව කොහේවත් අරගෙන ගියා මම දැක්කේ නැහැ. ඊට පසුව එතනින් අපි මෙම අධිකරණයට ආවා. ඇවිත් මෙහි සේවය කරන නිලධාරියෙක් ගේට්ටුව අසල සිටියා. ඒ පුද්ගලයා සමග කතා කලා. අද නිවාඩු දවසක් නිසා මහේස්ත්‍රාත් තුමා එන්නේ නැහැ. අද නිවාඩු දවසක් නිසා වැඩබලන මහේස්ත්‍රාත් තුමා තමයි එන්නේ. එයා සොයිසා මහතායි. එයා ඉන්නේ තානායන අසල කාර්යාලයයේය. එතනට යන්න කියලා ඔහු කියුවා. පසුව අපි තානායම අසල කාර්යාලයට ගියා. ඒ වැඩ බලන මහේස්ත්‍රාත්තුමා හමුවීමට යන කොට 11.00ත් 11.30ටත් විතර ඇති. අපි එතන ඉන්න කොට දවල් 12.00 ට විතර පයාගල පොලිසියෙන් මල්ලිව අරගෙන චන්ද්‍රසිරි කියන නිලධාරියා සමග තවත් නිලධාරියෙක් ජීප් රථයෙන් ආවා. ජීප් රථයෙන් ඇවිත් චන්ද්‍රසිරි කියන නිලධාරියා අනිත් නිලධාරියාට කතා කරලා අල්ලන්න කියලා තමයි මල්ලිව ජීප් රථයෙන් බැස්සුවේ. මල්ලිට ජීප් රථයෙන් බහින්න අමාරු තත්වයෙන් සිටියේ. මල්ලිව බිමට බස්සලා වැඩ බලන මහේස්ත්‍රාත් තුමා සිටිය කාර්යාලයට අරන් ගියා. එම කාර්යාලයට අපිට යන්න දුන්නේ නැහැ. වැඩ බලන මහේස්ත්‍රාත් තුමාගේ කාර්යාලයේ විනාඩි 5ක් විතර සිටියා. ඊට පසුව මල්ලි එලියට ගෙනාවා. පසුව ජීප් රථයට නග්ගන්න උත්සාහ කලා. ඒ පොලිස නිලධාරියාට බැරි වුනා.

2
02 APR 2019
COURT

මමත් අල්ලා ජීප් රථයට නැග්ගුවා. මල්ලි සමග මම කතා කලා. මම කියුවා මහේස්ත්‍රාත් තුමා ඉදිරියේ දී වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලන්න කියා. ඔයා ඉල්ලුවේ නැද්ද කියලා. එවේලේදි මම ඇසුවා, චන්ද්‍රසිරි කියන පොලිස් නිලධාරියාගෙන් ඇසුවා මෙයාට වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්නේ නැද්ද කියලා. එතකොට එම නිලධාරියා කියුවා. ඔය ගොල්ලො බෙහෙත් ගෙනාවානම් දෙන්න කියුවා. ඊට පසුව අපි ගියා,මල්ලි එහෙම කියුවාම මල්ලි කියුවා සිර ගෙදරට එන්න කියාල. අපි බන්ධනාගාරයට ගියා. කළුතර බන්ධනාගාරයට ගියා. බන්ධනාගාරයට වැඩ බලන මහේස්ත්‍රාත් තුමාගේ කාර්යාලයේ සිට පයින් යනවා නම් විනාඩි 5 ක දුර. මල්ලිව ජීප් එකට නග්ගන අවස්ථාවේ දි මා කියුවා වාහනයට නගින්න උදව් කලා කියලා. ඒ වෙලාවේ මගේ සහෝදරයාගේ ශරීරයේ යම් කිසි තුවාලයක් තිබුනා. එනම් මල්ලිගේ කණ අසල ලේ පැල්ලමක් තිබෙනවා මා දැක්කා. ඒ ලේ පැල්ලම සම්බන්ධයෙන් යම් කිසි නිලධාරියෙකුගේ අවධානයට ලක් කලා. එයා ඒක නොදැක්කා වගේ සිටියා. ඊට පසුව අපි බන්ධනාගාරයට ගියා. බන්ධනාගාරයට ගිය අවස්ථාවේදි බන්ධනාගාරයේ ඇතුලට යන්න බැරිවුනා. ගේට්ටුව අසල සිටියා. නිලධාරියාගෙන් ඇසුවා ඇයි ආවේ කියලා. අපි කියුවා ආපු කාරණාව. අපි ගියේ අක්කා සහ මායි පුංචි අම්මායි. මම බන්ධනාගාර නිලධාරිට කියුවා පයාගල පොලිසියෙන් එක්කගෙන ආපු ලසන්ත යන අයව බලන්නයි අපි ආව් කියලා කියුවා., ඒ නිලධාරියා කියුවා එහෙම අයෙක් ගෙනාවේ නැහැ කියුවා. බන්ධනාගාරයට ගියේ මල්ලිව බලන්න. මල්ලි එහි සිටිය හැකියැයි සිතුවේ, මල්ලි එහෙට එන්න කියුව නිසයි. එහි ගිය විට අපිට දැන ගන්න ලැබුනා මල්ලිගෙ නමින් හඳුන්වන කෙනෙක් බන්ධනාගාරයේ නැති බව. බන්ධනාගාරයේ භූමියේ අපි විනාඩි 20ක් විතර සිටියා. ඒ අවස්ථාවේදි මහේස්ත්‍රාත් තුමා ලගට අරන් ගියාම මෙහෙට අරන් ආවා කියුවා ඒ නිසයි අපි ආවේ කියුවා. ඒ ඉන්න අවස්ථාවේ දී පයාගල පොලිස් ජීප් රථයෙන් මල්ලිව බන්ධනාගාරයට අරගෙන ආවා. අපි දැක්කා. මල්ලිව ගෙනාපු අවස්ථාවේදි මා බන්ධනාගාර නිලධාරින්ට කතා කරලා කියුවා පොලිසියෙන් එයාට පහර දීලා එයා අසනීප වෙලා ඉන්නේ, එයාට වෛද්‍ය ප්‍රතිකාර ලැබුනේ නැහැ. දැන් මෙහාට ගේනවා කියලා තමයි ගෙනාව කියලා මගේ සහෝදරයාව බන්ධනාගාරයට ගෙනාවට පසුව සහෝදරයාව බිමට බැස්සුවා.

Scanned with CamScanner

02 APR 2019
HIGH COURT KALUTARA

මගේ මල්ලිට යම් පහර ගැසීමට ලක් වී ඇති බව බන්ධනාගාර නිලධාරීන්ට කියුවේ පොලිසියෙන් බන්ධනාගාරයට ගේන අවස්ථාවේදි මම කියුවා පොලිසිය මල්ලිට පහර දීලා මල්ලි අසනීපයෙන් ඉන්නේ, වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලුවාම බන්ධනාගාරයෙන් ලබා දෙනවා කියලායි කියුවේ. තවම මල්ලිට වෛද්‍ය ප්‍රතිකාරයක් ලැබුනේ නැහැ කියලා මම බන්ධනාගාර නිලධාරින්ට කියුවා. ඒ බව මම තමයි කියුවේ. මල්ලිට බන්ධනාගාරයට ගෙනාවා පසුව අපි උත්සාහ කලා බන්ධනාගාරය ඇතුලට යන්න. පොලිස් නිලධාරියා ඇතුලට යන්න ඉඩ දුන්නේ නැහැ. ඊට පසුව මම මල්ලිගෙන් මොකුත් ඇසුවේ නැහැ. බන්ධනාගාර නිලධාරියෙක් ඇතුලේ ඉන්න නිලධාරියකුට කතා කරලා කියුවේ මල්ලිගෙන් කට උත්තරයක් ගන්න කියා. පසුව පොලිස් නිලධාරින් ගියාට පසුව මල්ලිව බලන්න බන්ධනාගාරයේ නිලධාරින් ඉඩ දුන්නා. ඊට පසුව මා මල්ලිගෙන් ඇයි ඔයා මහේස්ත්‍රාත් තුමා ඉදිරියේ දී වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලනවා නේද කියලා මම (ඉල්ලුවේ නැත්තේ ඒ බව.) මල්ලිගෙන් ඇසුවා.බන්ධනාගාර නිලධාරින් මගේ මල්ලි සමග කතා කලා. බන්ධනාගාර නිලධාරින් මගේ මල්ලි එක්ක කතා කලේ මල්ලිට පහර ගැසීම සම්බන්ධයෙන්.

දැන් වේලාව සවස 4.00 යි වැඩි දුර විමසීම කල් තබමි.

කියවා තේරුම් කර දීමෙන් පසුව)

මා ඉදිරිපිටදි අත්සන් තබන ලදී. )

අත්/කලේ.

අත්/කලේ. සාක්ෂිකරු.

මහේස්ත්‍රාත්- කළුතර.

02 APR 2019

කළුතර මහේස්ත්‍රාත් ටී.පී.එස්.ඒ.පෙරේරා මැතිතුමා ඉදිරියේදිය.

නඩු අංකය: 46635 එන්.එස්.

දිනය: 2003.09.19

පෙනී සිටීම පෙර පරිදිය.

මෙ අවස්ථාවේදි ර.නි.මහතා පසුගිය දින නීති කෘත්‍යයක් ගේන් ඇතැයි කියන යතුරු ලියන දෝෂයන් කිහිපයක් නිවැරදි කිරීමට ඉල්ලා සිටී.

2003.08.22 වන දින ආරම්භයේදීම පැමිනිල්ල වෙනුවෙන් මා විසින් ඉල්ලා සිටියා 2002. ජුලි 26 දින සාක්ෂි සටහන් වල යතුරු ලියන දෝෂ නිවැරදි කිරීම සඳහා ඒවා නිවැරදි කර ඇත්තේ මේ අයුරින් යතුරු ලියන දෝස විවර කිරීම සඳහා යනුවෙන් එසේ නොව යතුරු ලියන දෝස නිවැරදි විය යුතුය. එදින නීති කෘතියේ 4 පිටුවේ මෙලෙස යතුරු ලියන වී තිබුනා. 16 දින මා නැවතත් පොලිසිය ආවා.මා ආවේ අක්කයි මමයි යනුවෙන් එය අක්කයි මමයි විය යුතුයි. එම පිටුවේම පේලි 3ක් පහලින් යතුරු ලියනය වී තිබුනා. ඇය මල්ලිව රෝහලට ඉ.පත් කරන්නේ නැත්තේ වික්‍රමරත්න මහතාගේ ඇය “ඇයි කියලා වික්‍රම රත්න මහතාගෙන් ඇසුවා විය යුතුයි”

5 වෙනි පිටුවේ තියෙනවා කකුල් සහ විලුඹ සම්පූර්ණයෙන් ඉදිමිලා තිබුනා. මේ තුවාල දැක්කාම මම කිව්වා මෙහෙමත් මිනිස්සුන්ට ගහනවාද තිරිසනුන්ට ගහනවාද’ එය නිවැරදි විය යුතුයි. මේ තුවාල දැක්කාම මම කිව්වා මෙහෙමත් තිරිසනුන්ට වගේ ගහනවාද කියා.

6 පිටුවේ වත්කම් කර ගෙන එනවා මම දැක්කා මගේ කුල් දෙක යනුවෙන් එය මල්ලිගේ කකුල් දෙක විය යුතුයි.

7 පිටුවේ එයා සොයිසා මහත්තයා එයා ඉන්නේ තානායක අසල කාර්යාලයේ එය තානායම විය යුතුයි. “

එම යතුරු ලියන දෝස නිවැරදි කිරීම සම්බන්ධයෙන් වි.නි.මහතා විරුද්ධ නොවේ.

මේ අනුව එම යතුරු ලියන නිවැරදි ආකාරයෙන් ඇතුලත් කිරීමට අවසර දෙමි.

Scanned with CamScanner

0 2 APR 2019

මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති, ගිය දිනයේ සාක්ෂි දෙනවිට කිව්වා හිටුවා කියා තමාගේ සහෝදරයාව රිමාන්ඩ් බන්ධනාගාරයට ගෙන යනවා. ඊට කලින් වැඩ බ.මහේ.තුමා වෙත ගෙන ගියා. සහෝදරයාව බන්ධනාගාර ගත කලේ 2000.06.17 දින. ඒ අවස්ථාවේදි මා සහෝදරයා හා කථා කලා. තවත් බන්ධ.නිලධාරින් සිටියා. බ.නිල මගෙන් ප්‍රශ්න කලා. අමාරුකම් ගැන. අතක් උස්සන්න බැහැ පණ නැහැ අත දැවිල්ලයි පපුව හා බඩ දනවා. සහෝදරයා කිව්වා. මම කථා කලා. මට දැනගන්න ලැබුනා පහර දුන් අය ගැන විස්තර කලා. මම ඇහුවා කවුද පහර දුන්නේ කියලා. මල්ලි මට කිව්වා බන්ධනාගාරයට ගෙනා පොලිස් නිලධාරියා ඇතුළු 6 දෙනෙක් පහරදුන් බවත් පපුවට බඩට පොලුවලින් පහර දුන් බවත් ප්‍රකාශ කලා. මට ඒ විස්තර දැනගන්න ලැබුනේ මල්ලිගෙන් වෛද්‍ය ප්‍රතිකාර ගත්තාද, මල්ලි ගෙන් ඇහුවා මහේස්ත්‍රාත් තුමා ගෙන් වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලුවේ නැත්තේ ඇයි කියලා. පොලිසිය මොනවා කරයිද කියලා දන්නේ නැති නිසා ඉල්ලුවේ නැහැ කිව්වේ. මල්ලි එදා දැක්කට පස්සේ මම ආයෙම මල්ලි පන පිටින් දැක්කේ නැහැ. අවසාන වශයෙන් ර.බ.ගාරයේ දැක්කා. මල්ලිගේ ශරීරයේ තුවාල මම දැක්කා ඒ සම්බන්ධයෙන් මම පොලිසියට කිව්වා මල්ලිට ප්‍රතිකාර දෙන්න කියා. මල්ලිට බෙහෙත් ලබා දීමට මා කටයුතු කලා. 18 වෙනිදා කළුතර බ.ගාරයට ආවා. සැකකරු පෙන්වන්නේ නැහැ ඉරිදා දිනයක් නිසා. 18 දාම ආපසු නාරාහේන්පිට යුධහමුදා පොලිසියට ගියා. පොලිසිය මල්ලි අත් අඩංගුවට ගත්තේ යුධ හමුදාවෙන් පැන ආ නිසා. පොලිසිය යුධ හමුදාවට බාරදෙන බව දැනගන්න ලැබුනු නිසා ඒ ගැන දැනගන්න ගියා. අම්මයි මමයි ගියා. අපි විශේෂ කාර්යාංශයේ හිටි නිලධාරියෙක් හමුවුනා. මල්ලි සම්බන්ධයෙන් මා කිව්වා අසනිපයි, බන්ධනාගාර ගත කර තිබෙනවා කියලා. ඒ අය කිව්වා පොලිසිය අපිට දන්වා නැහැ කියලා. ඔහුට ඇප දෙන දිනයට ඇවිත් අපි ඔහු ගන්නම් කිව්වා. ඊට පස්සේ 19 වෙනිදා මල්ලි බලන්න ආවේ නැහැ. එදා මාමා කළුතර බ.ගාරයට ආවා මල්ලි බලන්න.මාමාගේ නම විලියම්. මල්ලිව වැලිකඩ බන්ධනාගාරයට යවලා කියලා මාමාගෙන් පනිවිඩය ලැබුනා. කළුතර බ.ගාරයේ හිටියේ නැහැ. 20 වෙනිදා අම්මාට කිව්වා වැලිකඩ ගිහින් මල්ලි බලන්න කියා. අම්මා ගිහින් නැහැ. කවුරුවත් 20 දින ගියේ නැහැ.

Scanned with CamScanner

02 APR 2019

නාරාහේන්පිට පොලිසියට පැමිනිල්ලක් කලේ නැහැ. නමුත් ඒ අය අපිට දුරකථනය ලබා දුන්නා පොලිසියට දන්වනවද නැද්ද කියන එක දැනගන්න කියලා. 21 වෙනිදා මල්ලි සම්බන්ධයෙන් තොරතුරක් ලැබුනා තාත්තගෙන් තාත්තා මුල්ල කන්දගේ පියසේන වයස 57 යි. තාත්තගෙන් ලැබුනු තොරතුර නම් 21 පාන්දර පයාගල පොලිසියේ නිලධාරින් ලිපියක් ගෙනැත් දීල තිබුනා ඒක මට තාත්තා ගෙනැත් දුන්නා කියවලා බලන්න කියලා. ඒ ලිපිය කියෙව්වා. අපි ලඟ ඒ ලිපිය තියෙනවා. එහි සඳහන් වෙලා තිබුනේ අම්මාගේ නමින් තිබුනේ. අම්මත් සාක්ෂිකාරියක් පොඩිනෝනා. ඒ ලිපියේ තිබුනේ මැගසින් බන්ධනාගාරයේ අංකයක් තිබුනා එය යටතේ රක්ෂිත බන්ධනාගාර ගත කල මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර යන සැකකරු අසනීප වීමෙන් පසු වැලිකඩ බන්.රෝහලට ඇතුලත් කිරීමෙන් පසු 20 වන දින උදේ 8.45 ට මිය ගිය බවත් එම මරණ පරි. කටයුතු සඳහා වැලිකඩ බන්.ගාරයට පැමිණෙන ලෙසත් එහි දන්වා තිබුනා. 17 වන දින රක්ෂිත බ.ගාර ගතවුවාට පසු ලැබුනු නිල ආරංචිය තමයි ඔය ලිපිය. අපි මරණ පරීක්ෂණ කටයුතු වලට කලින් අපි පයාගල පොලිසියට ගියා. මල්ලි අසනීප වෙන්න හේතුව අපි දන්නවා. මල්ලිගේ මරණය සම්බන්ධ සැක නිසා පැමිනිල්ලක් කරන්න ගියා. 21 වෙනිදා පාන්දර ගියේ. පයාගල පොලිසිය අපේ පැමිනිල්ල සටහන් කර ගත්තේ නැහැ බැනලා පැන්නුවා තමුසෙලාට මෙහෙට එන්න කියලා නැහැ. එන්න කියලා තියෙන්නේ වැලිකඩට එහෙට යනවා මරණ පරීක්ෂණයෙන් පසුව බලා ගන්නවා මැරුනේ කොහොමද කියලා. අපි ඊට පසු මොරටුවේ අක්කාගේ නිවසට ගියා. ආපසු ගෙදර ආවා. ඇවිත් දකුනු කළුතර පොලිසියට ආවා. මල්ලිගේ මරණය සම්බන්ධව පැමිනිල්ලක් කරන්න. ද.ක. පොලිසියට. ඒ අයත් බාර ගත්තේ නැහැ. ආපසු නිවසට ගියා. නිවසට ගොස් අපි මරණ ප.කටයුතු සඳහා කොළඹ යන්න ඇවිත් සහකාර පොලිස් අධිකාරි කාර්යාලයට ගියා. පයාගල පොලිසිය භාර නිලධාරි හමුවන්න ගියේ. ඒ කාර්යාල නාගොඩ ප්‍රදේශයේ පිහිටා තිබුනේ. ඒ වෙලාවේ කවරුත් හිටියේ නැහැ. නිලධාරින්.මරන පරි. යන්න පෙර ගියේ. ඊට පස්සේ නාරාහේන් පිට යු.හ.පොලිසියට ගියා. මල්ලි පැන ආ නිසාත් ඊට කලින් දැක්වු නිසාත්. ඒ ගොල්ලන් මගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තා. යු.හ.පොලිසිය ප්‍රකාශය ගත්තේ 21 වෙනිදා. ලිඛිතව ගත්තා. ඊට පසු වැලිකඩ බන්ධනාගාරයට ගියා. එහි මෘත ශරීරය තිබුනේ

Scanned with CamScanner

7

02 APR 2019

නැහැ. එහි නිලධාරියෙක් සමග අපි බොරැල්ල පොලිස්ථානයට යැව්වා. ඒ මොකද, මල්ලිගේ මෘත ශරීරය තිබුනේ පොලිස් මෘත ශරිරාගාරයේ. පො.මෘ.ශරී. භාරයට ගියා.- අක්කයි, අම්මයි, මමයි, මල්ලියි, පුංචි අම්මයි. එහි තිබුනා අපිට පෙන්නුවා අපි හදුනා ගත්තා. ලසන්ත ජගත් කුමාර වන මගේ මල්ලිගේ බවට හදුනා ගත්තා. ඒ ශරිරයේ තුවාල තිබුනා දකුණු අත ගැලවිලා හම පිපිරිලා තිබුනා. කකුල් ඉදිමිලා තිබුනා. ඊට පස්සේ සාක්ෂි දුන්නා මරණ පරික්ෂණයකදී. බොරැල්ල පොලිසිය අපේ ප්‍රකාශ සටහන් කලා. එදින නොවේ සාක්ෂි දුන්නේ. 27 වෙනිදා මරණ පරික්ෂණයට සාක්ෂි දුන්නා. කොළඹ ප්‍රදේශයේ භාර උසාවියේදි ගරු මහේස්ත්‍රාත් තුමෙක් ඉදිරියේ සාක්ෂි දුන්නේ. 21 වන දින පොලිස් මෘත ශරිරාගාරයේදි දුටුවාට පසුව අපිට 21 හවස බාර දුන්නා. අපි ඊට පසුව අවසන් කටයුතු කලා. මරණ පරික්ෂණයක් තිබුනා. වෛද්‍ය වරයෙක් ඉදිරියේ පශ්.ම.පරි.තිබුනා. ඒ අවස්ථාවේ දි මා හදුනා ගත්තා මල්ලව වෛද්‍යවරියක් පරික්ෂණය පැවැත්තුවා. මරණයට හේතුව ප්‍රකාශ කලා වෛද්‍ය වරිය. “මා දැන ගත් පරිදි අක්කයි මාවයි කැඳවා මිනිස් රූපයක් ඇඳ කොටස් පෙන්වා මල්ලිගේ ශරිරය විශාල තැලිමකට භාජනය වෙලා තියෙනවා, මොට ආයුධ වලින් පහරදීම නිසා මෘදු පටක හා විශාල වශයෙන් තැලීම් නිසා පොලිස් පහර දීම් නිසා මියගිය බවත් වකුගඩු අක්‍රිය වූ බවත්, භූමදාන කටයුතු 24 වෙනිදා තිබුනේ. මල්ලිට වූ සිද්ධිය සම්බන්ධයෙන් පොලිසියට අයත් ආයතනයට පැමිනිලි කිරිමට අමතරව මානව හිමිකම් කොමිසමට පැමිනිලි කලා 22 වෙනිදා. මම කලේ. ඒ කාර්යාලය බොරැල්ලේ මානව හිමිකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යාලයට.

<u>හරස් ප්‍රශ්න:</u>

ප්‍ර: සහෝදරයා තමා මිය ගිය ලසන්ත කුමාර

උ: ඔව්.

ප්‍ර: ලසන්ත කුමාර 1997 ශ්‍රී ල.යුධ හමුදා බටයෙක්?

උ: ඔව්

Scanned with CamScanner

02 APR 2018 KALUTARA

ප්‍ර: යුධ හමුදාවෙන් ලබා දීපු හමුදා පුහුනුවෙන් පසු යුධ හමුදාවට අනුයුක්ත කලා?

උ; ඔව්.

ප්‍ර; ඒ බදවා ගත්තේ 1997.

උ; ඔව්.

ප්‍ර: හමුදාවට බැදුනු පසු රැකියාව සදහා කොයි තරම් කල් ගියාද?

උ: 1999 දක්වා ගියා ඊට පසු ගියේ නැහැ. 99 න් පස්සේ නිවාඩු දාපු ගමන් නතර වුනා.

ප්‍ර: මල්ලි පවුලේ 5 වෙනි ලමයා. තමුන් 2000 වසරේ රැකියාවක් කලාද?

උ: ඔව්.

ප්‍ර: රැකියාව කරන්න කලින් උසස් පෙල විභාගය සමත් වුනාද?

උ: ඔව්.

ප්‍ර: උසස් පෙල සමත්වු පසුද රැකියාව කලේ?

උ: නැහැ. කලා උපාධියේ 1 වසර සමත් වී තිබුනා.

ප්‍ර: සහෝදරයා 99 වසරේ යුධ හමුදාවෙන් නිවාඩුවට ගෙදර ඇවිත් ගියේ නැහැ කිව්වා?

උ: ඔව්.

ප්‍ර: තමුන් උපාධියක් කල කෙනෙක් හැටියට තමුන් දන්නවද එහෙම ගෙදර මල්ලිට ඉන්න බැහැ කියලා?

උ: දන්නවා.

ප්‍ර: ඒ වගේම යුධ හමුදා සේවයක් ලබපු කෙනෙක් හමුදාවට නොයා සිටීම වරදක් බව දන්නවාද?

උ: මල්ලි වෙනත් රැකියාවක නිරත වුනා සැගවී සිටියේ නැහැ.

ප්‍ර: තුමුන් කිව්වා හමුදාවෙන් ඇවිත් සිටිම වරදක් බව දන්නවා කිව්වා නේද?

උ; ඔව්.

ප්‍ර: මිලිටරි පොලිසියට ගියා කිව්වා නේද? මල්ලි යුධ හමුදාවට බැදෙන විට තමුන් ඔහු සමග ඉන්ටවිව් වලට ගියේ නැහැ පනාගොඩ පුහුනු වන විට ගියාද?

උ: විසිරයාමේ පෙලපාලියට ගියේ නැහැ.

ප්‍ර; හමුදාවෙන් ඇවිත් නොදන්නා සේවයට නොයෑම සම්බන්ධයෙන් තමුන් උගත් වැඩිහිටි සහෝදරිය හැටියට අවවාද කලා ද?

උ; යන්න කිව්වා විවාහ ජිවිතේ ප්‍රශ්න තිබුනු නිසා ගියේ නැහැ.

Scanned with CamScanner

0 2 APR 2019
HIGH COURT KALUTARA

ප්‍ර: තමුන් ඔහුට අවවාද කලේ නැද්ද? හමුදාවට යන්න කියා.

උ: අවවාද කලා මල්ලි සැහැවි සිටියේ නැහැ.

ප්‍ර: මල්ලි 1999 වන විට තමුන්ගේ ගෙදර නොවේ පදිංචි වෙලා හිටියේ?

උ: මල්ලි ගේ වෙනම නිවසක් තිබුනා ඒකේ හිටියේ. අපේ ගෙදර නොවේ.

ප්‍ර: ඒ කාලේ හමුදාවට නොදන්වා යන්නේ නැති කාලේ පොලිසියෙන් මල්ලි හොයන්න ආවද?

උ: නැහැ. දැනුවත්ව.

ප්‍ර: මල්ලිගේ ගෙදරට ගියාද?

උ: මම දැනුවත්ව නැහැ.

ප්‍ර: තමුන් කිව්වා මල්ලිගේ විවාහයට විරුද්ධ බව? නැනා තමුන් සමඟ තරහද

උ: මාත් එක්ක කථා කරනවා. මම ඒගෙදරට යනවා.

ප්‍ර: කොයි වෙලාවකවත් පොලිසියෙන් අත් අඩංගුවට ගන්නව දැක්කද?

උ: නැහැ.

ප්‍ර; ඒ කාලේ වෙනවිට මල්ලිට බි.ආර්.4097 කියලා මෙම අධිකරණයේ වරෙන්තු වෙලා තිබුනා තමා දන්නවාද?

උ: දන්නේ නැහැ.

ප්‍ර: තමුන් දැනගෙන හිටියද මල්ලි හමුදා සේවය ලබලා අවු 2ක් ඉදලා නොයා ඉදිමෙන් ඔහු අත් අඩංගුවට ගන්න පුළුවන් කියලා?

උ: දැනගෙන හිටියා.

ප්‍ර: කළුතර අධිකරණයේ මල්ලිට අත් අඩංගුවට ගැනිමට පෙර නඩුවක් තිබු බව දැන ගෙන හිටියද?

උ; ඒ වෙන විට තියෙනවද කියල දන්නේ නැහැ.

ප්‍ර: කලින් යම්කිසි නඩු තිබුනා කියලා දැනගෙන හිටියද?

උ: දැනගෙන හිටියා.

ප්‍ර: කුමන නඩු තිබුනා කියලද දැනගෙන හිටියේ?

උ; මත් පැන් බොන තැනක ඉදලා මල්ලි පොලිස් අත් අඩංගුවට අරගෙන තිබුනා.

Scanned with CamScanner

10
02 A[illegible] 2019

ප්‍ර: ඒකට කවුද ඇප වුනේ?

උ: අපි කවුරුවත් ඇප වුනේ නැහැ. පොලිසිය අධිකරණයට ඉදිරිපත් කලා.

ප්‍ර: ඔහු ඒ චෝදනාවක් ඉදිරිපත් කලාද?

උ: ඔහු නිවැරදි කරු කිව්වා.

ප්‍ර: ඇප තිබ්බෙ කවුද?

උ: මත් ද්‍රව්‍ය අයිති කෙනා මල්ලිට කියලා තිබුනා මෙ මුදල් ගෙවන විත්තිය. ඒ නිසා ගෙදරින් කවුරුත් ආවෙ නැහැ.

ප්‍ර: ගෙව්වද?

උ: මුදලාලි ගෙව්වෙ නැහැ. මල්ලි රිමාන්ඩ් වුනා.

ප්‍ර: එදා නඩුව බලන්න ආවාද?

උ; පස්සෙ බලන්න ආවා. රිමාන්ඩ් බන්ධනාගාරයට ගියේ නැත.

අධිකරණයෙන්: සිද්ධියට කොයි තරම් කලින් ද.

උ: 99 වසරේ.

ප්‍ර: හමුදාවෙන් මල්ලි ඇවිත් යන්නේ නැතුව ඉන්න කාලේද?

උ; ඔව්.

ප්‍ර: ඊට පසුව මල්ලි රිමාන්ඩ් එකෙන් ගෙනාවට පසු මල්ලිට දඬයක් ගැහුවාද?

උ: ඔව්.

ප්‍ර; ඊට අමතර මල්ලිට තිබුනු මත් ද්‍රව්‍ය නඩු මොනවද?

උ: වෙනත් නඩු නැහැ.

කියවා තේරුම් ගෙන නිවැරදි

බවට අත්සන් කලා: අත්/කලේ. අත්/කලේ.

මහේස්ත්‍රාත්.

Scanned with CamScanner

0 2 APR 2019
HIGH COURT KALUTARA

11.

කළුතර මහේස්ත්‍රාත් ටී.පී.එස් ඒ.පෙරේරා මැතිතුමා ඉදිරියේදිය.

නඩු අංකය: 46635

දිනය: 2003.10.17

පෙනී සිටීම පෙර පරිදිය.

පැ.සා.1 නැවත කැඳවයි. මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති.

මේ අවස්ථාවේදි පසු ගිය දින නීති කෘත්‍යාන්ගේ නිවැරදි කිරිම් කිපයක් කිරීමට ඇති බව ර.නි.මහතා අධිකරණයේ අවධානයට යොමු කරයි.

2003 සැප්. 19 දින 2 පිටුවේ මුල්ලකන්දගේ අමිතා ප්‍රියන්ති ගේ සාක්ෂි ආරම්භ කල අවස්ථාවේ උඩ සිට 4 පේලියේ මෙසේ යතුරු ලියනය වී ඇත. ඒ අවස්ථාවේ මා සහෝදරයා හා කථා කලා තවත් බන්. නිලධාරින් සිටියා. එය බන්ධනාගාර නිලධාරින් මල්ලිගෙන් ප්‍රශ්න කෙරුවා යනුවෙන් නිවැරදි විය යුතුය.

3 පිටුවේ පලවන වාක්‍ය යතුරු ලියනය වී ඇත්තේ ඒඅය අපිට දුරකථනය ලබා දුන්නා යන්න දුරකථන අංකය ලබා දුන්නා යනුවෙන් නිවැරදි විය යුතුය.

වි.නි. මහතා එම නිවැරදි කිරිම් පිලිබඳ විරුද්ධ නොවෙමින් ඊට එකඟ වේ.

ඒ අනුව එම නිවැරදි කිරීම් යථා පරිදි නිවැරදි කරන ලද සාක්ෂි කොටස් වශයෙන් පිලිගනී

සාක්ෂිකාරිය:

ප්‍ර: තමුන් ගිය දිනයේ කිව්වා ලසන්ත යන අය කසිප්පු නඩුවක වි.කරුවකු වශයෙන් අධි.ඉදිරිපත් වූ බව? පස්සේ දඩයක් ගැහු බව කිව්වා.

උ: ඔව්.

ප්‍ර: තමුන් කිව්වා තමුන් ඒ නඩුව බලන්න ආවේ නැහැ කියා.

උ: ඔව්.

ප්‍ර: තමුන්ගේ කවුරුත් ඇප වුනේ නැහැ කිව්වා.

උ: ඔව්. ඒක තමයි ඇත්ත.

ප්‍ර: ඒ නඩුවේ අංකය: 5790 කිව්වොත් පිලිගන්නවාද?

උ: මට මතක නැහැ.

ප්‍ර: එය තිබුනේ 1999

උ: ඔව්.

Scanned with CamScanner

12.
02 APR 2012

ප්‍ර: 1999 තමයි අධිකරණයට එය ඉදිරිපත් කලේ.

උ: 1999 මතකයි සැප්.මතක නැහැ.

ප්‍ර: එම නඩුව සැප්.මාසය මතක නැත්ද?

උ: නැහැ.

ප්‍ර: තමුන් කිව්වා පවුලේ අය හා තමුන් ආවේ නැහැ කියලා?

මම තමුන්ට පෙන්වනවා 5790 දරණ නඩුවේ නඩු වාර්තාව එය පෙන්වා සිටී. සහෝදරයාගේ නම ඇත්දැයි බලයි. නඩුවේ අංකය තිබෙනවා 5790 යනුවෙන් 2 පිටුව බලන්න 1999 සැප්.මාසයේ කථා කරලා තියෙනවා? එහි තමුන් ඇප කාරිය වශයෙන් ඉදිරිපත් වෙලා තියෙනවා.?

උ: තියෙනවා. ප්‍ර: 1999 සැප්.21 එදින තමුන් කවුරු හැටියටද ඉදිරිපත් වුනේ.

උ: ඇපකාරිය ලෙස.

ප්‍ර: 1999 සැප් 21 තමුන් ඇපකාරිය ලෙස ඉදිරිපත් වෙලා තියෙනවා.

උ: ඔව්.

ප්‍ර: තමුන් පිලිගන්නවාද අධිකරණයේ තමා පෙනී සිටි බවට?

උ: පිලිගන්නවා.

ප්‍ර: තමුන්ගේ සහෝදරයා 2000 වසරේ ජුනි මස 17 දින කළුතර ගරු.වැ.බ.මහේ.තුමා වෙත ඉ. පත් කලා.?

උ; ඔව්.

ප්‍ර: තමුන් පිලිගත්තා මල්ලි යුධහමුදාවෙන් පලා ආ පුද්ගලයෙක් බව?

එදා ජුනි 17 දින ගරු මහේ.තුමා වෙත ඉදිරිපත් කලේ කුමන චෝදනා සම්බන්ධයෙන් කියලද දැනගෙන හිටියේ.

උ: යුධ හමුදාවෙන් පැන ආ නිසා බව දන්නවා.

ප්‍ර: පස්සේ දැන ගත්තාද මොන චෝදනා සම්බන්ධවද කියලා?

උ: පසුව බන්.නිල.කිව්වා . වරෙන්තුවක් තියෙනවා කිව්වා සොරකමක් සම්බන්ධයෙන්.

Scanned with CamScanner

13

02 APR 2019
HIGH COURT KALUTARA

ප්‍ර: ඒ සොරකම කුමන ආකාරයේ එකක්ද?

උ: ඔවුන් විස්තර කලේ නැහැ. වතුර මෝටරයක් සම්බන්ධයෙන් කිවුවා.

ප්‍ර: බන්.නිලධාරින්.

ප්‍ර: වෙන චෝදනා මොනවාද?

උ: මම දන්නේ නැහැ.

ප්‍ර; තමුන් දන්නවාද වෙරගල පයාගල ගම,

උ: ඒක අපේ ගම.

ප්‍ර: තමුන් දන්නවාද ගමේ ඉන්න නිහාල් හෙට්ටි ආරච්චි කියන අය?

එයාගේ බිරිද දොඩන්ගොඩ හේවාගේ කුසුමා?

උ: ආච්චිගේ නෑයෙක්. එයා පදිංචි විදුහල් පාල.

ප්‍ර; තමුන් දැනගෙන හිටියාද කුසුමාවති මල්ලිට විරුද්ධව ගෙදරට අයුතු ඇතුල්වීමක් සම්බන්ධයෙන් පයාගල පොලිසියට පැමිනිල්ලක් කල බව 2000.04.21 දින.

උ: මූලික අයිතිවාසිකම් නඩුව වෙලාවේදි දැන ගත්තා එවැනි පැමිනිල්ලක් කරලා තිබුනු බව.

ඥාතියා පැමිණිල්ල කරලද දන්නේ නැහැ පොලිසිය ඉදිරිපත් කරලා තිබුනා.

ප්‍ර: තමුන් දන්නවාද පයාගල උපතැපැල් ස්ථානාධිපති දන්දූන්නගේ දෝන පත්මා පියසීලි.

ඒ කාන්තාව මල්ලිට විරුද්ධව කාන්තාවට අතවර කිරීමක් සම්බන්ධයෙන් පැමිනිල්ලක් කල බව දන්නවාද?

උ: නැහැ. ඒකත් දැන ගත්තේ මූලික අයිතිවාසිකම් නඩුවේ දී

ප්‍ර: තමුන් දන්නවාද මල්ලිට එය පැමිනිල්ල ආපු දවස?

උ: මල්ලි අත් අඩංගුවට ගත්තට පස්සේ පැමිණිල්ල ආලා තිබුනේ කියල මම දන්නේ.

ප්‍ර: තමුන් දන්නවාද පයාගල වෙරගල සොහොන ගාව පදිංචි අමරගේ දොන් රත්නපාල.

උ: ඔව්.

ප්‍ර: එයා සහෝදරයාට විරුද්ධව පැමිණිල්ලක් කරලා තිබුනාද?

උ: ඒකත් දැනගත්තේ මූලික අයිතිවාසිකම් නඩුවේදි?

ප්‍ර: ඒ පැමිණිල්ල මොකක්ද කියලා දැන ගත්තාද?

උ: මුදල් ප්‍රශ්නයක්.

Scanned with CamScanner

02 APR 2019



ප්‍ර: තමුන් කිව්වා 2000 වසරේ ජුනි 17 වෙනිදා මල්ලි ගරු වැ.බ. මහේ.තුමා වෙත ඉං.පත් කලා කියලා. එතුමාගේ කාර්යාලයට?

උ: ඔව්.

ප්‍ර: තමුන් ගියාද කාර්යාලයට?

උ: පොලිසිය යන්න දුන්නේ නැහැ.

ප්‍ර: සහෝදරයාව කාමරේ තුලට ගෙන ගොස් මහේ.තුමා වෙත පමුනුවනවා දැක්කාද?

උ: දැක්කේ නැහැ. ගෙනයනවා විතරයි දැක්කේ.

ප්‍ර: ඊට පස්සේ සහෝදරයා නැවත වතාවක් කාමරය තුල ඉදලා එලියට ආවා?

ඊට පස්සේ ඔහු බන් ගාරයට නියම කලා.

උ: මල්ලි කිව්වා රිමාන්ඩ් එකට එන්න කියලා අපි එතකොට දැන ගත්තා.

ප්‍ර: එලියට ඇවිත් තමුන් එක්ක කථා කලාද?

උ: වාහනයට නගගන්න මම උදව් කලා එතකොට කිව්වා අක්කේ රිමාන්ඩ් එකට එන්න කියලා.

ප්‍ර: වැ.බ.මහේ.තුමා වෙත ගෙනයන වෙලාවේ තමුන් ඒ ආසන්නයේ හිටියා?

උ: තානායම අසල ගේට්ටුව ගාව අපි හිටියේ. එතන ඉදලා ගේට්ටුව ලඟ කාමරයක මහේ.තුමා හිටියා.

ප්‍ර: තමුන් දන්නේ කොහොමද මහේ තුමා එතන ඉන්න බව?

උ: පොලිසිය කිව්වා එතන ඉන්න බව. පොලිස් නිලධාරියෙක් හිටියා එයා කිව්වා වැ.බ.මහේ තුමා ගේ කාර්යාලයට යන්න කියලා. ජුනි 17 වෙනිදා.

ප්‍ර: සහෝදරයාව දින කීපයක් පොලිසියේ තියාගෙන හිටියා?

උ: ඔව්.

ප්‍ර; මෙ පුද්ගලයා දවස් කීපයක් පොලිස්ථානයේ රදවා තබා ගැනීම සම්බන්ධයෙන් වැ.බ.මහේ!තුමාවෙත ඒ කාරනා දැනුම් දෙන්න කියලා නිතිඥ මහතෙකුගේ සහාය ලබා ගත්තාද?

උ: නි.මහතෙක් හමුවුනා. නි.මයා අසනීපයෙන් හිටියේ. ඒ මහතා කිව්වා මල්ලිට කියන්න කියලා වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය බව.

Scanned with CamScanner

15

02 APR 2019
HIGH COURT KALUTARA

ප්‍ර: තමුන් දන්නවා නි.මහතුන්ගේ කාර්යාල නිවාඩු දිනවල ඇරලා තිබෙන බව උසාවි ගේට්ටුව ලගට ඇවිත් කවුද වැඩ බලන්නේ කියා දැනගෙන ඒ මහතාගේ කාර්යාලයට ලගට ගියා.

උ: කිසිම කෙනෙකුගේ සහාය ලබා ගත්තේ නැහැ. මල්ලිගෙන් මම ඇහුවා මහේ තුමාගේ ඉදිරියේ කථා කරන්න පුළුවන්ද කියලා මල්ලි කිව්වා මම කියන්නම් කියලා?

නිවාඩු දිනයක් බැවින් මහත්තයෙක් එක්ක ගෙන එන්නද කියලා. මල්ලිගෙන් ඇහුවා කියන්න පුළුවන්ද කියලා මල්ලි හාන් කිව්වා. එතන තිබුනු කාර්යාලවල නි.මහතුන් හිටියේ නැහැ. එදා නිවාඩු දවසක්.

ප්‍ර: තමුන් කිව්වා මල්ලි ර.බ.ගත කල බව දැනගත්තා කියලා?

තමුන් ඇහුවාද මල්ලිගෙන් අර කථාව කිව්වද කියලා?

උ: බන්.ගාරයේදි ඇහුවා. වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලුවේ නැත්තේ ඇයි කියලා.

ප්‍ර; තමුන් දන්නේ කොහොමද ඒව අහන්න.

උ: වෛද්‍ය ප්‍රතිකාර ඉල්ලුවා නම් රෝහලට යවන්න ඕනනේ?

මල්ලි කිව්වා පොලිසිය හිටිය නිසා ඉල්ලුවේ නැහැ කියලා.

ප්‍ර: හමුදාවේ නේද මල්ලි හිටියේ. සහෝදරයා මේ කථාව කියලා නැහැ.

උ; නැහැ.

ප්‍ර: මල්ලිගෙන් ප්‍රශ්න කලා රි.එකට ගිහින්.ඇතුලට ගිහින් ප්‍රශ්න කරන්න දුන්නාද

උ: ජුනි 17 වෙනිදා කථා කරන්න දුන්නා. මම ඒ අය හදුනන්නේ නැහැ.ගේට්ටුවෙන් ඇතුලට යන්න අවසර ගත්තේ නැහැ. කලින් ර.බ.අය බලන්න ගොස් නැහැ.

ප්‍ර; බලන්න බැහැ අහවල් වෙලාවේ එන්න කිව්වේ නැද්ද?

උ: බ.නි.කිව්වා මල්ලි බලන්න ආව කියලා.

ප්‍ර: කාගෙන්ද අවසර ගත්තේ.

උ: 3 දෙනෙක් සිටියා. මල්ලි බලන්න ආවා කිව්වාම මල්ලිව අඩගහගෙන ආවා එතනට බන්.ගාරයට අපි ගියාට පස්සේ මල්ලි අරන් ගියාට අපිට කථා කරන්න දුන්නේ නැහැ.

Scanned with CamScanner

02 APR 2019



ප්‍ර: තමුන් මල්ලි සමග නිලධාරින්ට කයලා කථා කලා. කළුතරදි. නගර සභාවට අල්ලපු එකේද,

උ: ඔව්.

ප්‍ර: තමුන් කථා කලේ ර.බ.ගාරයේදි. තමුන් දන්නවා එහි පිහිටීම එලිය තියෙන්නේ මිදුල වගේ කැල්ලක් දොර ඇරියට පසුව තමයි දොර ඇරලා වහන්නේ එලියෙන් මොකුත් පේන්නේ නැහැ. තමුන් ගිහින් මුලින් හිටියේ මිදුලේ ද?

උ: පාක් එකට යන පාරේ හිස් ඉඩමේ. හිටියේ. පාරේ තමයි හිටියේ. බන්.ෂෙල් එකට පිට පාරේ මම හිටියේ. මල්ලිව ගෙනාවා මේ ස්ථානයට. ඉන් පසු එයාව ඉඩමට අයිති ගේට්ටුවක් තිබේනම් එහිඉන්නවා. බ.නිලධාරියෙක්. ශාලාවට යන්නේ ගේට්ටුව ඇරලා එහි තවත් බටයෝ ඉන්නවා මේ අය ඇතුලට දාන්න.

ප්‍ර: තමුන් එනකන් මේ බන්.ගාරයේ කවුරුත් හඳුනන්නේ නැහැ? පාරේ හිටිය තමුන් ජනේලයෙන් කොහොමද කථා කලේ.

උ; නිලධාරියෙක් ඇහුවා ඇයි ඔතන ඉන්නේ කියලා. එයාගේ නම දන්නේ නැහැ. අපේ මල්ලි අරන් ආවා බලන්න ආවා කිව්වා. වෙලාව 12.00- 1.00 ත් අතර ඇති. ඒ වන විට බන්.ගාරයට ගොනැත් නැහැ. මල්ලිම අරන් ගියාට පසුව අපි ගියා. ඒ වන විට මල්ලි ගෙනැත් නැහැ. ඊට පස්සේ වි.25 කින් විතර ගෙනාවා. මල්ලි.

ප්‍ර: මල්ලි සමග කථා කලේ කීයටද?

උ; මල්ලි බලන්න ඕනැයි කිව්වාම පොඩ්ඩක් ඉන්න කියලා ජනේලය ලගට ගෙනවිත් පොලිසිය ගියාට පසුව මල්ලි පෙන්නුවා.

~~ප්‍ර:: මල්ලි බලන්න ඕනැයි කිව්වාම පොඩ්ඩක් ඉන්න කියලා ජනේලය ලගට ගෙනවිත් පොලිසිය ගියාට පසුව මල්ලි පෙන්නුවා.~~

ප්‍ර: මල්ලිගෙන් ඇහුවාද කථාව කිව්වාද කියලා,

උ: ඇහුවා මහේ. තුමාගෙන් වෙ. ප්‍රතිකාර ඉල්ලුවේ නැත්තේ ඇයි කියලා.

ප්‍ර: තමුන් දැනගත්තේ කොහොමද ප්‍රතිකාර ඉල්ලුවේ නැති බව.

අධිකරණයෙන්:- මල්ලිව පෙන්වන්න ගෙනාවාම කවුද කථා කලේ, මල්ලිද තමුන්ලද?

උ: මුලින් කථා කලේ මල්ලි. පොලිසියෙන් ගැහුවා කිව්වා.

Scanned with CamScanner

17.

0 2 APR 2019

ප්‍ර: තමුන් විනාඩි 5 කින් පමන මල්ලි වෛ. ප්‍රතිකාර ඉල්ලුවේ නැහැ කියලා දැන ගත්තා?

උ; මල්ලි කිව්වා බන්.නිලධාරින් ඇහුවා මොනවද අමාරු කියලා. එතකොට තේරුනා වෛ.ප්‍රතිකාර ඉල්ලලා නැහැ කියලා.

ප්‍ර: තමුන්.වෛද. ප්‍රතිකාර දෙන්න උත්සාහ කලාද?

උ: රිමාන්ඩ් එකේ අය ප්‍රතික්ෂේප කලා ක්‍රීම් එක ගන්න එක.

ප්‍ර: මල්ලිව බන්.ගාරය මගින් කොළඹ ගෙන ගියාද?

උ; එදා ගෙනයනවා දුටුවේ නැහැ.

ප්‍ර: බන්.නිල.බාර ගත්තා තමුන් ගෙදර ආවා.

උ: බන්.නිලධාරින් මල්ලිව පෙන්වන්න බැහැ කියලා 18 වෙනිදා කිව්වා.

18 මල්ලිව දැක්කේ නැහැ.

ප්‍ර: මල්ලිව කොළඹ ගෙනගිය බව දැන ගත්තේ 19 වෙනිදා.?

උ: මම කොළඹ 19 ගියේ නැහැ. 19 වෙනිදා කවුරුවත් මල්ලි බලන්න

කොළඹ ගියේ නැහැ. කළුතරට ආවම තමයි දැන ගත්තේ කොළඹ ගෙන ගිය බව.

19 දිනත් ආවා කළුතර බන්.ගාරයට.

ප්‍ර: 19 වෙනිදා තමුන්ද දැනගත්තේ.

උ; මාමා කිව්වා ගෙදර ගිහින්. මම වැඩට ගිහින්.

ප්‍ර: 19 කවුරුවත් දැක්කේ නැද්ද මල්ලිව?

උ: නැහැ. 20 දින වත් ගෙදර අය ගියේ නැහැ.

ප්‍ර: කවදද දැන ගත්තේ මල්ලි මියගිය බව?

උ: 21 පාන්දර දැන ගත්තේ.

ප්‍ර; තමුන් කියන විදියට බන්.නිලධාරින් ඉදිරියේ 17 වෙනිදා මල්ලිත් එක්ක තමුන් කථා කලාට පසු තමුන් දැක්කේ නැහැ මල්ලිව පනපිටින් ඉන්නවා. අන්තිමට කථා කලේ මල්ලි එක්ක බන්.ගාර භාරයේ ඉන්න විට?

උ; ඔව්.

Scanned with CamScanner

02 ... 2019

18.

ප්‍ර: තමුන් මල්ලිට කිසිම පොලිස් නිලධාරියෙක් කිසිම පහරක් දෙනවා දැක්කද?

උ; නැහැ.

ප්‍ර: ඒ වගේම 18 වෙනිදා තමුන් දැනගෙන හිටියා තමුන්ගේ මල්ලි කළු බන්ධනාගාරය තුල ඉන්න බව තමුන් ඒ අය තමුන්ට පෙන්නුවේ නැහැ.

උ: ඔව්.

ප්‍ර; තමුන් කිසිම අවස්තාවක දැක්කේ නැහැ පොලිසිය අත් අඩංගුවට ගන්නවා?

උ: නැහැ.

ප්‍ර: තමුන් තමුන්ගේ මල්ලි කොළඹ බන්.ගාරයේ 2000 ජුනි 21 දින මිය ගොස් කියලා දැන ගන්න ලැබෙන තුරු. තමුන් ලිඛිතව කිසිම ස්ථානයකට පැමිනිල්ලක් කරලා තිබුනාද?

උ: නැහැ.

ප්‍ර: ගෙදර අයවත් කිසිවෙක් ජුනි 21 දින මල්ලි මිය යන තුරු ලිඛිත පැමිනිල්ලක් කර තිබුනද?

උ; නැහැ.

නැවත ප්‍රශ්න:

ප්‍ර: මල්ලි රක්.බන්ගත වු පසු කොළඹ ගිහින් බැලුවේ නැත්තේ ඇයි කියලා ඇහුවා.

ඒ කාලයේ තමුන්ගේ පියා හොද සනීපෙන් හිටියාද?

උ: තාත්තා කොලඹ ගිහින් සොයා ගන්න දන්නේ නැහැ. තාත්තා අසනීපයෙන්. මම එදා 10 වෙනිදා වැඩට ගියා.

ප්‍ර: විශේෂ හේතුවක් තිබුනාද කොළඹ ගිහින් බලන්න බැරි.

උ: ගෙදර අයට පැපොල හැදිල තිබු න නිසා මට දිගින් දිගට නිවාඩු ගන්න සිදුවෙලා තිබුනා.

ඒ වගේම සෙනසුරාදා දිනයේ අනිවාර්යයෙන් අධ්‍යාපන කටයුතු වලට ආයතනයෙන් නිවාඩු ලබාගෙන තිබෙන්නේ. ඒ නිසා ආයතනයෙන් නිවාඩු ලබාගන්න අපහසු වුනා.

මා හැර හැම දෙනාටම පැපොල හැදුනා මල්ලි මිය යන්නට පෙර.

ප්‍ර: ඒ වගේම හරස් ප්‍රශ්න ඇහුවා මල්ලිට විරුද්ධව තිබුනා යයි සැලකෙන යම් යම් නඩු සම්බන්ධයෙන් තමා පිළිගත්තා නඩු සම්බන්ධයෙන් වරෙන්තු තිබු බව.

උ; මත් ද්‍රව්‍ය සම්බන්ධ නඩුවක්. මා දැනගෙන සිටියේ නැහැ ඒ ගැන එය මත් පැන් සම්බන්ධ නඩුවක්.

Scanned with CamScanner

~~19.~~

02 APR 2019
HIGH COURT

ප්‍ර: තමාගේ මල්ලිට වෙච්ච මේ හානිය සම්බන්ධයෙන් තමා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කලා ද?

උ: ඔව්.

ප්‍ර: හරස් ප්‍රශ්න වලදි ප්‍රකාශ කලා මත්පැන් නඩුවට අමතරව අනිත් පැමිනිලි සම්බන්ධයෙන් දැන ගත්තේ මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කලාට පසුව කියලා?

උ; මූලික අයිතිවාසිකම් ගොනු කල නි.මහතා ලියුමක් දුන්නා මල්ලිට විරුද්ධව පොලිසියේ තිබෙන පැමිනිලිවල පිටපත් ලබා දෙන්න කියලා. ඒ අවස්ථාවේ මම එය පොලිසියට ඉදිරිපත් කලා. නමුත් පොලිසිය මට නි.මයා හරස් ප්‍රශ්න අහපු පැමිනිලි සම්බන්ධ පිටපත් නොවේ වෙනත් ඒවා ලබා දුන්නා.

ප්‍ර: මල්ලි මිය යන විට මත්පැන් නඩුවට අමතරව වෙනත් නඩුවට වරදකරු වෙලා හිටියාද?

උ: නැහැ.

ප්‍ර: මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කල පසු දැන ගන්න ලැබුනු වි.උගත් නී.මයා විසින් ඔබගේ අවධානය යොමු කලා මල්ලිට එරෙහිව පොලිසියට පැමිනිලි ඉදිරිපත් කරලා තිබුනේ කවදාද කියලා?

උ: ඒකත් තිබුනේ මල්ලි අත් අඩංගුවේ ඉන්නකොට.

ප්‍ර; ඒ මොකක් සම්බන්ධවද?

උ: පියසීලි යන අය විසින් දාන ලද පැමිනිල්ල.

කියවා තේරුම් ගෙන නිවැරදි

බවට පිළිගෙන අත්සන් කලා.

අත්/කලේ.

මහේස්ත්‍රාත්.

2003.නො.07 ප.ව. 1.30 ට විභාගය.

අත්/කලේ.

මහේස්ත්‍රාත්.

Scanned with CamScanner

02 APR 2020

කළුතර මහේස්ත්‍රාත් ටී.ජී. එස්. ඒ.පෙරේරා මැතිතුමා ඉදිරිපිටදිය.

නඩු අංකය: 46635/එන්එස්.

දිනය: 2006.03.23.

විත්තිකරු නැත.

පෙනී සිටීමක් ද නැත.

පැමිණිල්ල පෙනී සිටීම පෙර පරිදිය

අතුල පියසිරි වයස 48 සි/බු. ප්‍රතිඥා දෙයි. භාෂණ පරිවර්තක.

කළුතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 46635 නඩු වාර්තාවට ගොනු කර ඇති අධිකරණ වෛද්‍ය නිලධාරි ඩී.අයි.එල්. රත්නායක මහතා මියගිය මුල්ලකන්දගේ ලසන්ත ජගත් කුමාර නැමැති අය වෙනුවෙන් 2000.06.21 දින පවත්වන ලද (කොළඹ අධි.වෛද්‍ය මෘත ශරීරාගාරයේ දී) ප.ම.ප.වාර්තාව පැ.3 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරමි.

අත්/කලේ.

මහේස්ත්‍රාත්.

කියවා තේරුම් කර දී අත්සන් කරන ලදී.

අත්/කලේ.

සාක්ෂිකරු.

Scanned with CamScanner

0 2 APR 2019
KALUTARA

ගරු මැතිතුමනි මෙ අවස්ථාවේදි පැමිනිල්ලේ නඩු භාණ්ඩ පැ1, පැ2 සහ පැ.3 මුල් සාක්ෂි ලැයිස්තුවේ සාක්ෂි අංක 1,2,3,4,5 සහ අතිරේක සාක්ෂි ලැයිස්තුවේ 3 සහ 4 යන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවා පැමිනිල්ල වෙනුවෙන් ලඝු නොවන පරීක්ෂණය අවසන් වන බව කියා සිටිමි.

නියෝගය

මෙම නඩුවේ චූදිත අද අධිකරණයේ නොමැති අතර ඒ අනුව අ.න.වි.ස.ප්‍ර.අනුව ඔහුට චෝදනාව කියවා තේරුම් කර දීමට හැකියාවක් නැත.

ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බැවින් මෙම නඩු විභාගය මහාධිකරණයට තබමි. නඩු භාණ්ඩ සමග මුල් නඩු වාර්තාව පිටපතක් තබා ගෙන මුල් නඩු වාර්තාව මහාධිකරණයට යවන්න. අවශ්‍ය පිටපත් සංඛ්‍යාව සකස් කොට අධි චෝදනා සකස් කිරිම සඳහා නීතිපති තුමා වෙත යවන්න නියම කරමි.

අත්/කලේ.

මහේස්ත්‍රාත් - කළුතර.

Scanned with CamScanner

61

0 2 APR 2019

HIGH COURT KALUTARA

**සහතිකය:**

මෙහි පසු පිටු වලින් පිටු අංක: 01-61 දක්වා දැක්වෙන්නේ කළුතර මහාධිකරණ නඩු අංක: එච්සි.570/13 දරණ නඩුවේ අධි චෝදනා පත්‍රය, කාර්ය සටහන්, 1 වන සාක්ෂිකරුගේ සාක්ෂි සටහන් සහ අවසාන නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

සැසඳු. ලි.
~~සකස්~~ කලේ :

සැසඳුවේ:

රෙජිස්ට්‍රාර්

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර
මහාධිකරණය
කළුතර.

රිසිට් අංකය: එෆ්/24 -378546

2019.03.08

Scanned with CamScanner